


ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස:

# පැවැත්ම සඳහා වූ අරගලය

වාර්තාව

ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර මාධ්‍ය නිදහස සහ
ප්‍රකාශනයේ නිදහස පිළිබඳ දූත මණ්ඩලය

2007 ජනවාරි

මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳව වූ
ජාත්‍යන්තර නියෝජිත කණ්ඩායම සමන්විත වූ සංවිධාන:

ආර්ටිකල් 19
මාධ්‍යවේදීන් ආරක්‍ෂා කිරීමේ කමිටුව (CPJ)
නිදහස් හඬ
ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය (IFJ)
නිදහස් ප්‍රකාශන හුවමාරුව පිළිබඳ ජාත්‍යන්තරය (IFEX)
ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගිතාවය (IMS)
ජාත්‍යන්තර ප්‍රවෘත්ති පත්‍ර ආයතනය (IPI)
ජාත්‍යන්තර ප්‍රවෘත්ති ආරක්‍ෂණ ආයතනය (INSI)
සීමා මායිම් නැති වාර්තාකරුවෝ (RSF)
දකුණු ආසියානු මාධ්‍ය කොමිසම (SAPC)
එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය (UNESCO)
ප්‍රජා ගුවන් විදුලි ජාත්‍යන්තර සංවිධානය (AMARC)
ලෝක ප්‍රවෘත්ති පත්‍ර සංවිධානය (WAN)
ලෝක මාධ්‍ය නිදහස් කමිටුව (WPFC)

මෙම වාර්තාවේ එන සොයා ගැනීම් පදනම් වන්නේ
2006 ඔක්තෝබරයෙහි ශ්‍රී ලංකාවට පැමිණි ඒකාබද්ධ දූත මණ්ඩලයෙහි සොයාගැනීම් මතය.

කවරයේ ඡායාරූපයඃ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

## කෙටි සඳහන් කිරීම් වලින් හඳුන්වනු ලබන්නේ;

| | |
|---|---|
| AMARC | ප්‍රජා ගුවන් විදුලි ජාත්‍යන්තර සංවිධානය |
| ANCL | ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම |
| CPA | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය |
| EPDP | ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය |
| FMM | නිදහස් මාධ්‍ය ව්‍යාපාරය |
| GoSL | ශ්‍රී ලංකා ආණ්ඩුව |
| IDP | අභ්‍යන්තර සරණාගතයා |
| IFJ | ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය |
| IMS | ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගිතාවය |
| INSI | ජාත්‍යන්තර ප්‍රවෘත්ති ආරක්ෂණ ආයතනය |
| IPI | ජාත්‍යන්තර ප්‍රවෘත්ති පත්‍ර ආයතනය |
| LTTE | දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය |
| MRPC | මාධ්‍ය සම්පත් පුහුණු කේන්ද්‍රය (යාපනය) |
| PCCSL | ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම |
| RSF | සීමා මායිම් නැති මාධ්‍යවේදියෝ |
| SAPC | දකුණු ආසියානු පුවත්පත් කොමිසම |
| SLA | ශ්‍රී ලංකා යුධ හමුදාව |
| SLBC | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව |
| SLPI | ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය |
| TMA | දෙමළ මාධ්‍ය සංධානය |
| UNESCO | එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය |
| WAN | ලෝක ප්‍රවෘත්ති පත්‍ර සංවිධානය |
| WPFC | ලෝක මාධ්‍ය නිදහස් කමිටුව |

මාධ්‍ය නිදහසත්, ප්‍රකාශණයේ නිදහස සහ මාධ්‍ය සහයෝගයත් පෝෂණය කිරීමෙහිලා තොරතුරු බෙදාහදා ගැනීමේ අභිලාෂයෙන් මෙම වාර්තාව ප්‍රකාශයට පත් කෙරේ. මෙහි එන තොරතුරු 2006 ඔක්තෝබරයේ දී ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර දූත කණ්ඩායම විසින් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවන් සහ දූත කණ්ඩායම වෙත ලැබුණු ලිඛිත දායකත්වයන් ඇසුරින් සකස් කෙරිණි. එම තොරතුරු මත පදනම්ව කිසියම් අදහස් ප්‍රකාශ කිරීමක් හෝ ක්‍රියාවක් කිරීමට බලාපොරොත්තු වන අය මෙම තොරතුරු ස්වාධීනව නැවත පරීක්ෂා කිරීම සුදුසුය. මෙම වාර්තාව පිළිබඳව පුද්ගලිකව හෝ සංවිධාන ලෙස දක්වනු ලබන ප්‍රතිචාර සහ යෝජනා භාරගැනීමට දූත මණ්ඩලය සූදානම්ය. ඒවා සහභාගි වූ සංවිධාන වෙත යොමු කළ හැකිය. (මෙම වාර්තාවේ අග කොටසෙහි සංවිධානවල සබඳතා තොරතුරු ඇතුළත්ය.)

# පටුන

සාරාංශය . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 4

1. හැඳින්වීම . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 6

2. ආරක්ෂාව සහ මුක්තිය . . . . . . . . . . . . . . . . . . . . . . . . . 8

3. වාරණය . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 12

4. මාධ්‍ය ප්‍රතිපත්ති පරිසරය . . . . . . . . . . . . . . . . . . . . . . 15

5. නිරීක්ෂණ සහ නිර්දේශ . . . . . . . . . . . . . . . . . . . . . . . 17

6 ඇමුණුම් . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 19

6.1 ඇමුණුම 1 : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 19
ශ්‍රී ලංකාවේ මාධ්‍ය සේවකයන්ට එරෙහි ප්‍රහාර සඳහා වූ මුක්තිය අහෝසි කරන ලෙස දකුණු ආසියානු කර්තෘවරුන්ගේ දූත කණ්ඩායම වෙනුවෙන් ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ සභාපති ක්‍රිස්ටෝෆර් වොරන් වෙතින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක සහ අමාත්‍ය ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා වෙත යවන ලද විවෘත ලිපිය

6.2 ඇමුණුම 2 : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .22
"2006 හදිසි නීති රෙගුලාසි හඳුන්වාදීම පිළිබඳ ප්‍රකාශනය
- විකල්ප ප්‍රතිපත්තිය කේන්ද්‍රය සහ
"නව පියවරයන් පිළිබඳ ප්‍රකාශනය"
- නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

6.3 ඇමුණුම 3 : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .27
"ආණ්ඩුව උතුරේ සහ නැගෙනහිර මාධ්‍ය නිදහස මර්දනය කිරීම හෙළා දකියි" අනුෂ පැල්පිට ආණ්ඩුවේ මාධ්‍ය අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද ප්‍රකාශනය. 27 ඔක්තෝබර් 2006

6.4 ඇමුණුම 4 : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .28
ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගීතාවය වෙතින් අමාත්‍ය සහ ආරක්ෂක ප්‍රකාශක ගරු කෙහෙළිය රඹුක්වැල්ල සහ ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහත්වරුන් වෙත දූත මණ්ඩල වාර්තාව ඉදිරිපත් කරමින් යවනු ලබන ලිපිය

7. ජාත්‍යන්තර සංවිධානවල සබඳතා විස්තර . . . . . . . . . . . 30

# සාරාංශය

ශ්‍රී ලංකාවේ මාධ්‍යවල තත් කාලීන තත්ත්වයත්, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) ය සමඟ වූ ගැටුම් උත්සන්න වීම නිසා ඇති වී තිබෙන බලපෑමත් මැන බැලීම පිණිස මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳව වූ ජාත්‍යන්තර දූත කණ්ඩායමක් තොරතුරු සොයා බැලීමේ සහ නිර්දේශ ඉදිරිපත් කිරීමේ සංචාරයක යෙදිණි.

ජාත්‍යන්තර දූත කණ්ඩායම ශ්‍රී ලංකාවේ සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාමය මාධ්‍ය පිළිබඳව විමර්ශනය කිරීමේ දී විශේෂ අවධානයක් දක්වන ලද්දේ විශේෂයෙන් ගැටුම් වල බලපෑමට යටත් වූ ප්‍රදේශවල අඛණ්ඩ ප්‍රහාරයනට බලවත් ලෙස ලක්ව ඇති දෙමළ භාෂාමය මාධ්‍ය වලට ඇති වී තිබෙන පීඩාකාරී බලපෑම කෙරෙහිය. මෙම තත්ත්වය විසින් උතුරු නැගෙනහිර පළාත්වල තොරතුරු නිදහස් ලෙස ගලා යාම සීමා කරනු ලැබ ඇති අතර, එම තත්ත්වය එකී  ප්‍රදේශ වල මෙන්ම දිවයින පුරාමද ජනතාවගේ දැනුවත් භාවය පවත්වාගෙන යාමට බාධාවක් ව පවතී. මේ මගින් දේශීය ප්‍රජාවන් කටකතා වලට සහ වෛරී භාෂාවට නැඹුරු වීම් ඉඩකඩ විවෘත වන අතර ඒ මගින් ගැටුම්කාරී තත්ත්වයට සහ අස්ථාවර තත්ත්වයකට සමාජය මෙහෙයවීමේ අවදානමක් ඇති කරනු ලබයි.

(LTTE) පාලන ප්‍රදේශ වලදී මාධ්‍ය ක්‍රියාකාරිකයන් නිදහසේ වාර්තා කිරීමෙන් වළක්වනු ලැබීමේ ඍජු ප්‍රතිඵලය ලෙස මාධ්‍ය නිදහස සහ අදහස් පළකිරීමේ නිදහස බලවත් ලෙස පාලනය කරනු ලැබ තිබේ.

## ආරක්ෂාවට සම්බන්ධ සොයා ගැනීම්

විශේෂයෙන් සන්නද්ධ කල්ලි සහ සන්නද්ධ කණ්ඩායම් විසින් සිදු කෙරෙන තර්ජනය කිරීම්, පැහැර ගැනීම් සහ ප්‍රහාරයන් හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ මාධ්‍ය වල ආරක්ෂාව බලවත් පරිහානියකට ලක්ව ඇති බව ජාත්‍යන්තර දූත මණ්ඩලයට සොයා ගැනීමට හැකි විය.

2005 අගෝස්තු මාසයේ සිට මාධ්‍ය ක්‍රියාකාරිකයන් නව දෙනෙකු ඝාතනය කර තිබිණි. මරණ තර්ජන කිරීමේ සහ හිරිහැර කිරීමේ අවස්ථා ගණනාවක් මෙන්ම ප්‍රවෘත්ති පත්‍ර බෙදා හැරීම නැවැත්වීමේ හිංසාකාරී උත්සාහයන්ද ගණනාවක් සිදු වී තිබිණි.

ඊට අමතරව ඝාතනය සිදු කරනු ලැබූ පුද්ගලයන් හඳුනා ගත් බවට සාක්ෂි තිබියදී පවා එවැනි සිද්ධි සම්බන්ධයෙන් අදාළ බලධාරීන් කර ඇත්තේ අවම පියවර ගැනීම හෝ පියවර නොගැනීමයි.

ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳාගත යුත්තේ සාකච්ඡාමය විසඳුමකින්ය යන මතයට සහාය පළකරන්නවුන් මෙන්ම ගැටුම් පාර්ශවයන් එකිනෙකෙහි ආධාරකරුවන් "ද්‍රෝහීන්" ලෙස නම් කරනු ලැබ ඇති අතර වෛරී භාෂාව භාවිතා කිරීම පුළුල් ලෙස පිළිගැනෙන තත්ත්වයට පත්ව තිබේ. මෙම තත්ත්වය යටතේ බොහෝ මාධ්‍ය ක්‍රියාකාරිකයන් සැඟවී සිටින අතර සමහරුන් එසේ සිටිනු ලැබ ඇති කාලය හය මසක් ඉක්ම ගොස් තිබේ. සමහර අවස්ථා වලදී මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ පවුල් වල සාමාජිකයන් හට පවා තර්ජන එල්ල වී තිබේ.

## අවිධිමත් වාරණය පිළිබඳ සොයා ගැනීම්

යම් ආකාරයක වාරණයක් ක්‍රියාත්මකව පවතින බව දූත කණ්ඩායම විසින් සොයා ගනු ලැබිණි. එහෙත් එය පුළුල් ලෙස ක්‍රියාවේ යොදවනු ලැබ ඇත්තේ වක්‍ර ක්‍රම මඟිනි. ආණ්ඩුවේ ගමන් මාර්ගය අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන්නන් ඔත්තු කරුවන් හෝ ද්‍රෝහීන් ලෙස නම් කරනු ලැබීමේ ඉඩ කඩ තිබේ. දේශපාලනඥයන්ගේ කැමැත්ත හෝ වෙනත් දේ ප්‍රසිද්ධියේ විවේචනය කිරීමෙන් වැළකීමේ ස්වයං වාරණය මාධ්‍ය තුළ ශක්තිමත්ව ඇති

අතර ප්‍රකාශන නිදහස පිළිබඳ අදහස් පළ කිරීම ජීවිත තර්ජනය ගෙන එන ක්‍රියාවක් බවට පත්ව තිබේ. සන්නද්ධ හමුදාවන් මාධ්‍ය වාරණයක් පැනවීම පිළිබඳ උනන්දුවන් දක්වන බව අගෝස්තු මාසයේදී ජනාධිපතිවරයා මාධ්‍ය වල කර්තෘවරුනට පැවසූ බව වාර්තා වී තිබේ. 2006 සැප්තැම්බර් 20 වැනිදා දාතමින් මාධ්‍ය ආයතන වෙත ලිපියක් යවන ආරක්‍ෂක අමාත්‍යංශය "එකතු කරගනු ලබන ප්‍රවෘත්ති පැහැදිලි කරගනු ලැබීමට සහ තහවුරු කරනු ලැබීමට යටත් කළ යුතු" බවට ඉල්ලීමක් කර තිබේ. එම ඉල්ලීමේ අරමුණ කුමක් වුවත් එය වාරණයක් පැනවීමේ උත්සාහයක් පිළිබඳව සලකා බැලීමකි. මාධ්‍ය ආයතනවලට නිල තොරතුරු ලබා දීමේ දී ද බොහෝ විට සැලකිල්ල දක්වෙන්නේ එම ප්‍රවෘත්ති මඟින් කෙනෙක් දුරට ආණ්ඩුවට සහයෝගය ලැබෙන්නේ දැයි යන කරුණු කෙරෙහිය.

රජය මගින් ගන්නා ලද ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලයක් ලෙස චන්ද්‍රිකා රූපවාහිනී සේවාවක් වසා දමනු ලැබීමෙන් ජනතාවට විදේශීය ප්‍රවෘත්ති වැඩ සටහන් නැරඹීමේ අවස්ථාව අහිමි කරනු ලැබිණි. තෝරාගත් චිත්‍රපට සහ රූපවාහිනී නාට්‍ය තහනම් කරනු ලැබීම, සමහර චිත්‍රපට විදේශ වල දී පෙන්වීමට බාධා පැමිණවීම සහ සහතික කිරීමේ ක්‍රියාවලියට කරන ලද මැදිහත් වීම් ආදිය ප්‍රකාශනයේ නිදහස කෙරෙහි බලවත් බලපෑමක් ඇති කරන කරුණුය.

## මාධ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවලට සම්බන්ධ සොයා ගැනීම්

තවමත් ක්‍රියාවේ යොදවා නැති නමුත්, 2005 අගෝස්තු 18 දින ස්ථාපිත කරන ලද හදිසි නීති රෙගුලාසි මඟින් මාධ්‍ය වලට එරෙහිව පූර්ව වැළැක්වීමේ පුළුල් බලතල රජය වෙත ලබා දී තිබේ.

නිල රහස් පනත (OSA) මඟින් දුර්වල ලෙස අර්ථ නිරූපනය කර ඇති "නිල රහස්" හෙළි කිරීම වරදක් බවට පත් කරනු ලැබ තිබේ. ඊට අමතරව 1973 පුවත්පත් මණ්ඩල නීතිය මඟින් කැබිනට් තීරණ, කැබිනට් ලිපි ලේඛණ, සමහර ආරක්‍ෂක කරුණු මෙන්ම පොදු දේපළ පංතියක් පිළිබඳ කරුණුද හෙළිදරව් කිරීම තහනම් කර තිබේ.

තවමත් ක්‍රියාත්මක කර හැකි නමුත් ජුනි මාසයේ දී රජය ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ඔස්සේ මාධ්‍ය රාජ්‍ය පාලිත නියාමනයකට යටත් කිරීමේ ප්‍රතිපාදන වලට අනුමැතිය ලබා ගෙන තිබේ. දෙසැම්බර් 6 වැනිදා ආණ්ඩුව හදිසි නීති (ත්‍රස්තවාදය සහ විශේෂිත ත්‍රස්ත ක්‍රියාකාරකම් වැළැක්වීමේ) රෙගුලාසි හඳුන්වා දෙනු ලැබීය.

මෙම රෙගුලාසි වලින් ප්‍රකාශනයේ නිදහසට සිදුවන බලපෑම හේතු කොට ගෙන එය සිවිල් සමාජයේ පුළුල් විවේචනයට ලක්විය.[1]

2003 කැබිනට් රැස්වීමේදී කෙටුම්පතක් ලෙස අනුමත කරනු ලැබුවා වූත් තොරතුරු නිදහස් පනත නීතිගත කිරීමේ කටයුත්ත ඉටුකිරීම ආණ්ඩුව ඉදිරියේ තිබේ. රට තුළ ගුවන් විදුලි විකාශනය සඳහා වූ නෛතික රාමුව රජයේ සහ පුද්ගලික යන අංශ දෙකෙහිම ගුවන් විදුලි විකාශනය කරන්නවුන්ගේ ස්වාධීනත්වය සහතික කිරීමට අපොහොසත්ව තිබේ. රජයේ ගුවන් විදුලි විකාශකයන්හට ඇත්තේ ඉතා අඩු සංස්කරණ ස්වාධීනත්වයකි. එසේම මහජන සේවා වටිනාකම් ස්ථාපිත කිරීමේ වුවමනාවක්ද එහි නැත. මුද්‍රිත මාධ්‍ය ක්‍ෂෙත්‍රය ගත් කල රජයේ හිමිකාරිත්වය පුළුල් කිරීම හෝ වෙනස් කිරීමක් පිළිබඳව අවධාරණය කරනු ලැබුවත්, එම අදහස නිර්දේශ කරන ලද කමිටු වාර්තා කිහිපයක් ඉදිරිපත්ව තිබියදීත් තවමත් ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ANCL හෝ ලේක්හවුස් නමින් හඳුන්වන) පාලනය රජය සතුව පවතී.

1. හදිසිනීති (ත්‍රස්තවාදය වැළැක්වීමේ සහ තහනම් කිරීම්) රෙගුලාසි 2006 හඳුන්වාදීම පිළිබඳ නිවේදනය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ නව පියවරයන් පිළිබඳව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නිවේදනය සඳහා කරුණාකර ඇමුණුම 2 බලන්න.

# 1 හැඳින්වීම.

## 1.1 ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර මාධ්‍ය නිදහස පිළිබඳ දූත මණ්ඩලය

2006 ඔක්තෝබර් 9 සිට 11 දින දක්වා ඉහළ මට්ටමේ නියෝජිතයන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ ජාත්‍යන්තර දූත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කළේය. එය ජාත්‍යන්තර මාධ්‍ය නිදහස සහ මාධ්‍ය සංවර්ධන සංවිධාන වල නියෝජිතයන්ගෙන් සමන්විත වූ අතර ඔවුහු ශ්‍රී ලංකාවේ තොරතුරු සොයා බැලීම සහ මාධ්‍ය හා ප්‍රකාශනයේ නිදහස වෙනුවෙන් පෙනී සිටීම තම දූත මෙහෙවර ලෙස සලකා ක්‍රියා කරන ලද්දකි.

මෙම දූත කණ්ඩායමට සහභාගි වෙමින් මෙම වාර්තාවේ සංස්කාරක වරුන් බවට පත්වූ සංවිධාන පහ මෙසේය. ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය, ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගීතාවය, ජාත්‍යන්තර මාධ්‍ය ආයතනය, ජාත්‍යන්තර ප්‍රවෘත්ති ආරක්ෂණ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය.

දූත මෙහෙවරෙහි අරමුණ වූයේ රටෙහි තත්කාලීන මාධ්‍ය තත්ත්වයත් ශ්‍රී ලංකා ආණ්ඩුව සහ දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය අතර ගැටුම උත්සන්න වෙමින් පවතින තත්ත්වය තුළ එහි බලපෑමත් පිළිබඳව විමසා බැලීමත්ය.

මෙම මෙහෙවර තුළ දී ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රජාව අතර සංවාදය සහ සබඳතාවයන් ශක්තිමත් කිරීම පිළිබඳව සොයා බැලූ අතර මාධ්‍ය වල තත්ත්වයත් දිවයිනේ ප්‍රකාශනයේ නිදහසත් පිළිබඳව අධිකාරීන් සහ ගැටුම්කාරී පාර්ශවයන් හි අවධානය ට ලක් කිරීම කෙරෙහි ද සැලකිල්ල යොමු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයේ මූලධර්ම ලෙසත්, දිවයිනට කල්පවත්නා සාමයක් ගොඩනැගීම සඳහා වූ අත්‍යවශ්‍ය සාධක ලෙසත් මාධ්‍ය නිදහසත් ප්‍රකාශනයේ නිදහසත් පැවැතීමේ කේන්ද්‍රීය අවශ්‍යතාවය දූත මණ්ඩලය අවධාරණය කරයි.

මෙම අරමුණ සපුරාගනු සඳහා ජාත්‍යන්තර දූත මණ්ඩලය වත්මන් මාධ්‍ය සහ ප්‍රකාශන නිදහසේ තත්ත්වය පිළිබඳ විවිධ අදහස් දරණ පුළුල් ක්ෂේත්‍ර ගණනාවකට අයත් පිරිස් මුණගැසුණේය. ඒ අතර මාධ්‍යවේදීන්, කර්තෘවරුන්, මාධ්‍ය විධායකයන්, නීති විශාරදයන්, ආණ්ඩුවේ නියෝජිතයන්, දේශපාලන පක්ෂ සාමාජිකයන්, ආරක්ෂක හමුදාවන් සහ ජාත්‍යන්තර ප්‍රජාවේ නියෝජිතයන්ද විය.

## ජාත්‍යන්තර දූත මණ්ඩලයෙහි පුළුල් සහභාගිත්වය

ජාත්‍යන්තර මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳව වූ දූත මණ්ඩලය ලෙස නමින් මූලික ලෙස හඳුන්වනු ලැබූ දූත මණ්ඩලය තුළ අවිධිමත් කණ්ඩායමක් ලෙස පහත සඳහන් ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයන්ද ඇතුළත්ව සිටියහ.

- ආර්ටිකල් 19
- මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව (CPJ)
- නිදහස් හඬ
- ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය (IFJ)
- ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගිතාවය (IMS)
- ජාත්‍යන්තර ප්‍රවෘත්ති පත්‍ර ආයතනය (IPI)
- ජාත්‍යන්තර ප්‍රවෘත්ති ආරක්ෂණ ආයතනය (INSI)
- සීමා මායිම් නැති වාර්තාකරුවෝ (RSF)
- දකුණු ආසියානු මාධ්‍ය කොමිසම (SAPC)
- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය (UNESCO)
- ප්‍රජා ගුවන්විදුලි ජාත්‍යන්තර සංවිධානය (AMARC)
- ලෝක ප්‍රවෘත්ති පත්‍ර සංවිධානය (WAN)
- ලෝක මාධ්‍ය නිදහස් කමිටුව (WPFC )

## 1.2 වාර්තාවේ ව්‍යුහය

මෙම වාර්තාව කොටස් තුනකින් යුතුව ක්ෂේත්‍ර තුනක් කෙරෙහි ඉලක්ක කරනු ලැබ තිබේ. ඒ සෑම කොටසක්ම මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහසට අදාළ කරුණු එකක් හෝ කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරයි. මෙම වාර්තාව තුළ තම අවධානයට යොමු වූ සියලු කරුණු ලැයිස්තුවම ඉදිරිපත් කිරීමට අදහස් නොකරයි. නමුත් වත්මන් ආරක්ෂක තත්ත්වය කෙරෙහි අදාළ වන්නේ යැයි දූත මණ්ඩලය විසින් හඳුනාගනු ලැබූ කරුණු ඉදිරිපත් කරනු ලබයි.

වාර්තා පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි තම අවධානය යොමු කරයි.

ආරක්ෂාව සහ මුක්තිය

වාරණය

මාධ්‍ය ප්‍රතිපත්ති පරිසරය

මෙම වාර්තාවට අදාළ අමතර තොරතුරු සැපයීමට හෝ දූත මෙහෙවර සම්බන්ධ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ඔබ අදහස් කරන්නේ නම්, කරුණාකර මෙම වාර්තාවේ අග සපයා ඇති ලේඛණයේ සඳහන් තොරතුරු ඔස්සේ දූත මෙහෙවරට සහභාගි වූ ඕනෑම සංවිධානයක් ඇමතිය හැකිය.

## 1.3 සාමාන්‍ය පසුබිම

දශක දෙකක පමණ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා ආණ්ඩුව දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) සමඟ ගැටුමක පැටලී සිටියි. 1976 දී පිහිටුවන ලද එල්. ටී. ටී. ඊ සංවිධානය දිවයිනේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ජීවත් වන දෙමළ සුළුතර ජනගහනය වෙනුවෙන් වෙනම රාජ්‍යයක් නිර්මාණය කරගැනීම අරමුණුකර ගන්නා ලද්දකි.[2]

1983 දී එම ගැටුම වඩාත් ප්‍රචණ්ඩ බවට පත් වූ අතර එතැන් සිට LTTE ය ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් සමඟ විටින් විට සටන් කළේය. ගතවූ දශක දෙක තුළ මෙම ගැටුම හේතුවෙන් දළ වශයෙන් 70000 ක් පමණ හමුදා සහ සිවිල් පුරවැසි ජීවිත විනාශ වී තිබේ.[3]

ඊට අමතරව තවත් 700000 ක පමණ පිරිසක් දේශීය වශයෙන් සහ විදේශගතව සරණාගතව වෙසෙති.[4]

2001 දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ LTTE සංවිධානය වෙන් වෙන්ව ඒක පාර්ශ්වීය සටන් විරාමයක් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව එකඟතාවයක් අත්සන් කිරීමට සුදුසු වාතාවරණයක් බිහි විය. එම එකඟතාවය 2002 පෙබරවාරි මාසයේ පටන් ක්‍රියාත්මක වන්නට පටන් ගත්තේය. අනතුරුව ආණ්ඩුවත් LTTE යත් අතර සාකච්ඡාවන් 2002 සැප්තැම්බරයෙහිදී ආරම්භ විය. එම සාකච්ඡා 2003 අප්‍රේල් මාසයේදී ඇණ හිටියේය. හුදකලා සිදුවීම් මඟින් ගිවිසුම උල්ලංඝනය වීම් සිදුවුවද 2002 සටන් විරාමය පැවැතිනි. වඩාත් දැඩි මතධාරී ආණ්ඩුවක් 2005 දී තේරී පත්වූ අතර එහි නායකත්වය දරණ ජනාධිපති රාජපක්ෂ මහතා LTTE ය සමඟ සාමයක් ඇති කර ගැනීමට උත්සාහ කරමින් සිටියි.

2006 අප්‍රේල් මාසය වන විට එතෙක් පැවැති තත්ත්වය වඩාත් හානිකර ලෙස උත්සන්න වූයේ සටන් විරාමය නමට පමණක් පවතින්නක් බවට පත් කරමිනි. ජිනිවා හිදී පැවැති සාකච්ඡාවෙහිදී ආණ්ඩුවත් LTTE යත් දෙකම 2002 සටන් විරාමයට තමන් ගරු කරන බව ප්‍රකාශ කළ ද අප්‍රේල් වන විට ත්‍රිකුණාමලය ප්‍රදේශයේ හිංසාකාරී ක්‍රියාවන් ආරම්භ විය.

උතුරෙහි වු යාපනය අර්ධද්වීපයෙහි ද ගැටුම් උත්සන්න වීම හේතුවෙන් මානවවාදී ගණන් බැලීම්වලට අනුව 100000 ක පමණ ජනතාවකට ඉන් බලපෑමක් ඇති වූ බව ප්‍රකාශ විය. සිවිල් ජනතාවට සිදු වූ අනතුරු පිළිබඳව සංඛ්‍යාවන් හෙළිකරනු නොලැබුවත් එවැනි අනතුරු බහුලව සිදු වූ බව වාර්තා විය.

ආරක්ෂක තත්ත්වය අඛණ්ඩව වඩාත් නරක අතට හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව දෙසැම්බර් 6 දා ත්‍රස්තවාදී විරෝධී රෙගුලාසි හඳුන්වා දුන්නේය. ඒ මඟින් ආරක්ෂක හමුදාවනට පරීක්ෂා කිරීමේ, අත්අඩංගුවට ගැනීමේ සහ ප්‍රශ්න කිරීමේ ප්‍රබල බලතල හිමි වේ.[5] ත්‍රස්තවාදී විරෝධී රෙගුලාසි මීට පෙර බලපැවැත්වුනේ 2002 සටන් විරාමයට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේය.[6]

2. ශ්‍රී ලංකාවේ වාර්ගික සංයුතිය සිංහල 74%, ශ්‍රී ලංකා දෙමළ 12%, ඉන්දියන් දෙමළ 6%, මුස්ලිම් 6%, සහ බර්ගර්, මැලේ සහ වැදි ජනතාව 1% ක් වශයෙනි. ආගමික සංයුතිය බෞද්ධ 69%, හින්දු 15%, ක්‍රිස්තියානි 8% සහ ඉස්ලාම් 8% සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් තුන නිල භාෂාවන්ය. Handbook of the Media in Asia (නවදිල්ලිය, සේජ් ප්‍රකාශකයෝ 2000)
3. මානව හිමිකම් පිළිබඳ ශ්‍රී ලංකා වාර්තාව 2001 (US State Department - Bureau of Democracy,Human Rights & Labour. March 2002
4. නිශ්චිතවම බොහෝ දෙමළ ජනයා ශ්‍රී ලංකාවෙන් දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවට පලාගොස් තිබේ. දැනට එහි සරණාගතයන් 65000ක් සිටිතැයි වාර්තාවේ. (Human Rights Watch. World Report-Sri Lanka)
5. ශ්‍රී ලංකාව ත්‍රස්ත විරෝධී නීති ගෙන එයි. (BBC World Service website. 6 December 2006)
6. මෙහිදී සඳහන් කළ යුත්තේ ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත (PTA) නැවත හඳුන්වාදී ඇත්ද යන්න සහ එසේනම් ඒ කුමන කොටස්ද යන්න පැහැදිලි නැති බවය. 2006 දෙසැම්බරයේ ගෙනා ත්‍රස්ත විරෝධී රෙගුලාසි ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත නොවේ. මෙසේ පැහැදිලි භාවයක් නැති නමුත් ජනාධිපතිවරයා සහ අගමැතිවරයා සඳහන් කළේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) නැවත හඳුන්වාදීමේ සූදානමක් ඇති බවය. කෙසේ නමුත් එය නැවත ක්‍රියාවේ යෙදවූ බවට ප්‍රකාශිත සටහනක් නැත.

# 2 ආරක්ෂාව සහ මුක්තිය

දූත මණ්ඩලය මුණ ගැසුණු මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ අදහසට අනුව 2006 වසර යනු, දිවයිනේ වාසය කරන්නවුන්ගේ මතකයෙහි වඩාත් අයහපත් වසරකි. දහස් ගණනක් අභ්‍යන්තර අවතැන්වූවන්, අතුරුදහන් වීම්, මිය යාම් සහ ඉහළම මට්ටමේ ඝාතන රැසක් එම වසර තුළ වාර්තා වී තිබිණි. විශේෂයෙන් දෙමළ මාධ්‍ය ඇතුළත්ව මාධ්‍ය ක්‍රියාකාරිකයන් වෙත ප්‍රහාර ගණනාවක් එල්ල වී තිබූ අතර ඒ වන විට ගත වී තිබූ වසර එකහමාරක කාලය තුළ පුද්ගලයන් නවදෙනෙකු ඝාතනයට ලක්ව තිබූ බව ජාත්‍යන්තර දූත මණ්ඩලයේ සොයාගැනීම්වලට ඇතුළත් විය. මෙම සංදර්භය තුළ පොදුවේ මාධ්‍යයන්ට එරෙහිව මරණීය තර්ජන සහ පුවත්පත් බෙදාහරින්නට පහරදීම් වැනි සෙසු ආකාරවල හිංසාකිරීම් ද තිබිණි. මේ සියල්ල ශ්‍රී ලංකාවේ මාධ්‍ය වෙත භීෂණයේ තැතිගැන්ම ඇතිකරවන සිදුවීම්ය.

ගත වූ වසර එකහමාරක කාලය තුළ ඝාතනය කෙරුණු මාධ්‍ය ක්‍රියාකාරිකයන් මෙසේය.

**ධර්මරත්නම් සිවරාම් - 2005 අප්‍රේල් 29**

ධර්මරත්නම් සිවරාම්ගේ සිරුර සොයා ගැණුනේ කොළඹ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු සංකීර්ණය ආසන්නයේ අධි ආරක්ෂක කලාපයේ දී ය. සිරුර සොයා ගනු ලැබූ දිනට පෙර දින රාත්‍රියේ 10.30 ට පමණ නාඳුනන කල්ලියක් විසින් අවන්හලකින් පිටත දී සිවරාම් පැහැරගනු ලැබිණි. ඔහුගේ සිරුර හමු වූ අධි ආරක්ෂක කලාපය නිරන්තරයෙන් ශ්‍රී ලංකා ආරක්ෂක අංශවල මුර සංචාර සිදු කෙරෙන ප්‍රදේශයකි. ප්‍රධාන පෙළේ ස්වදේශීය කණ්ඩායම් ඔහුගේ මරණය පිළිබඳව ආණ්ඩුව වෙත චෝදනාව එල්ල කරනු ලැබීය. "තාරකී" නමින් ප්‍රකටව සිටි ධර්මරත්නම් සිවරාම් ඩේලි මිරර් ඉංග්‍රීසි භාෂාමය පුවත්පතට දේශපාලන කොළම් රචනා කළ අයෙකු වූ අතර tamilnet.com නමැති අන්තර්ජාල අඩවියේ සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයකු ද විය. ඒ හැරුණු කොට ඔහු ශ්‍රී ලංකා රජය ප්‍රසිද්ධියේ විවේචනය කරන්නෙකු ද විය.

**රේලංගී සෙල්වරාජා - 2005 අගෝස්තු 12**

රේලංගි සෙල්වරාජා සහ ඇගේ සැමියා නාඳුනන තුවක්කුකරුවකු විසින් වෙඩි තබා ඝාතනය කරන ලද්දේ දහවල් 1.00 ට පමණ කොළඹ බම්බලපිටියේ දීය. සෙල්වරාජා මුලින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නිවේදිකාවක ලෙස කටයුතු කර තිබූ අතර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාධ්‍යවේදිනියක ලෙස සේවය කරමින් සිටියාය.

**සුබ්‍රමානියම් සුගයිධරාජන් - 2006 ජනවාරි 24**

ත්‍රිකුණාමල වරායේ සේවකයකු මෙන්ම මාධ්‍යවේදියකු ද වූ සුගයිධරාජන් වෙඩි තබා ඝාතනය කරන ලද්දේ ඔහු උදෑසන සේවයට යෑමට බස් නැවතුමේ සිටියදීය. ඔහු ත්‍රිකුණාමලයේ ක්‍රියාත්මක ව සිටි හමුදා සහ අතුරු හමුදා කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පිළිබඳ විවේචනාත්මක ඡායාරූප සහ ප්‍රවෘත්ති වාර්තා කිහිපයක් "සුඩරොලි" පුවත්පත මගින් ප්‍රකාශයට පත්කර තිබිණි. සුගයිධරාජන් විසින් ඡායාරූප ගත කරන ලද, ජනවාරි 2 වෙනිදා ත්‍රිකුණාමලයේදී මියගිය ශිෂ්‍යයන් 5 දෙනෙකුගේ ඡායාරූප ප්‍රකාශයට පත් වීම හේතුවෙන් එම මියයාම් සිදු වුයේ ග්‍රෙනේඩ් බෝම්බයක් පුපුරා යාමෙන් බවට එතෙක් ප්‍රකාශිතව තිබූ මුල් වාර්තාවන් අභියෝගයට ලක් විය.

**සුරේෂ් කුමාර් සහ රන්ජිත් කුමාර් - 2006 මැයි 3**

මාධ්‍ය ක්‍රියාකාරිකයන් ලෝක මාධ්‍ය නිදහස් දිනය සැමරීමට කොළඹට රැස්ව සිටිය දී උතුරේ ප්‍රධාන නගරය වූ යාපනයේ පිහිටි "උදයන්" ප්‍රවෘත්තිපත්‍ර කාර්යාලයට හඳුනා නොගත් පිරිසක් ප්‍රහාරයක් එල්ල කළහ. එම ප්‍රහාරයෙන් උදයන් පුවත්පතේ අලෙවි කළමනාකරු වූ සුරේෂ් කුමාර් සහ බෙදාහැරීමේ අංශයේ සේවයේ නියුතුව සිටි රංජිත් කුමාර් යන දෙදෙනා මරණයට පත්වූහ. තවත් පස් දෙනෙකුට තුවාල සිදු වූ අතර

කාර්යාලයට ද හානි සිදුවිය. පොලිසිය පුද්ගලයන් 6 දෙනෙකු අත් අඩංගුවට ගත් නමුත් ඔවුන් ඇප පිට නිදහස් කරන ලදහ. යාපනයේ සමහර මූලාශ්‍රවලට අනුව අත්අඩංගුවට පත් පුද්ගලයන් කිසි ලෙසකින් එම සිද්ධියට සම්බන්ධ වූවන් නොවේ.

**ලක්මාල් ද සිල්වා - 2006 ජූලි 2**

නිදහස් මාධ්‍යවේදියකු වූ ලක්මාල් ද සිල්වා නාඳුනන කණ්ඩායමක් විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබුවේ 2006 ජූලි 2 වැනිදාය. ඔහු කොළඹ දකුණු ප්‍රදේශයේ බොරලැස්ගමුවේ පිහිටි ඔහුගේ දෙමාපියන්ගේ නිවසින් පැහැරගෙන යනු ලැබුවේ උදෑසන 5.00ට පමණය. වෙඩිතබා ඝාතනය කෙරුණු ඔහුගේ සිරුර නිවසේ සිට කිලෝමීටර් තුනක් පමණ ඈත ස්ථානයක දී හමුවිය. ලක්මාල්ගේ මව ප්‍රකාශ කළේ ඔහු කලක සිට හඳුනන හමුදා නිලධාරීන් පිරිසක් හමුවීමට ගිය බවය.

**මරියදාස් මනෝජන්රාජ් - 2006 අගෝස්තු 1**

පුවත්පත් අලෙවි කරන්නකු වූ මරියදාස් මනෝජන්රාජ් අටවා තිබූ බෝම්බයක් පුපුරා යාමෙන් මියගියේ ජූලි 27 වෙනිදා බෙදා හැරීම සඳහා පුවත්පත් ගෙන ඒමට යාපනයට යමින් සිටියදීය. මෙම ප්‍රහාරය එල්ල වූයේ දෙමළ භාෂා පුවත්පත් යාපනයට බෙදාහැරීමට එරෙහිව මරණීය තර්ජන එල්ල වී තිබියදීය.

**සතාසිවම් බාස්කරන් - 2006 අගෝස්තු 16**

සතාසිවම් බාස්කරන් යාපනයේ මුද්‍රණය කෙරෙන "උදයන්" පුවත්පතේ බෙදාහැරීමේ අංශයේ රියැදුරෙකි. ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කරන ලද කාලය තුළ පුවත්පත බෙදා හැරීම සඳහා අවස්ථාව ලබා ගත් බාස්කරන් පුවත්පත් බෙදාහරින වාහනය තුළ දීම වෙඩි තබා ඝාතනය කර තිබිණි. ඔහු ඝාතනය කෙරුණේ ඉතා පැහැදිලිව උදයන් පුවත්පතට අයත් බව සටහන් කර තිබූ වාහනය රජයේ හමුදා පාලනය පවතින ප්‍රදේශයේ පදවාගෙන යද්දීය. ටැමිල්නෙට් වෙබ් අඩවියට අනුව වෙඩි තැබීම සිදු කර ඇත්තේ හමුදා සොල්දාදුවන් විසිනි.

**සින්නතම්බි සිවමහාරාජා - 2006 අගෝස්තු 21**

යාපනයේ මුද්‍රණය කෙරෙන දෙමළ භාෂාමය "නමුදු ඊළනාඩු" පුවත්පතේ කළමනාකාර අධ්‍යක්ෂ වරයා වූ සින්නතම්බි සිවමහාරාජා වෙඩි තබා ඝාතනය කරනු ලැබ තිබුණේ වෙලිප්පලෙයි ප්‍රදේශයේ දීය. එම ඝාතනයත් සමඟම "නමුදු ඊළනාඩු" පුවත්පත ප්‍රකාශනය නැවතිණි.

තර්ජනයට ලක් වූ මාධ්‍ය ක්‍රියාකාරිකයෝ තමන්ගේ සහ තම පවුල්වල සාමාජිකයන්ගේ ආරක්ෂාව පිළිබඳව ඇති බිය නිසා තම කාර්යාලවල මෙන්ම මිතුරන්ගේ සහ ඥාතීන්ගේ නිවෙස්වල ද ආරක්ෂාව අපේක්ෂා කරති. පොලිස් ආරක්ෂාව අපේක්ෂා කරමින් සමහරුන් පොලිසිය වෙත පැමිණිලි ඉදිරිපත් කර තිබේ. ඒ අනුව ආරක්ෂක කටයුතු සඳහා එවන ආරක්ෂකයන් හට ආහාර පාන සහ ප්‍රවාහන පහසුකම් සැපයීමද බොහෝ විට එම ආරක්ෂාව අපේක්ෂා කරන්නා වෙතම පැවරේ. ඊට අමතරව දූත මණ්ඩලයට දැනගන්නට ලැබුණේ ආණ්ඩුව පිළිබඳව විවේචනාත්මක වූ මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ ගමන් බිමන් ආදිය රාජ්‍ය ආරක්ෂක අංශ විසින් විමර්ශනයට ලක්කරනු ලබන බවය.

මාධ්‍ය ක්‍රියාකාරිකයන් මුහුණ දෙන බලවත්ම දුෂ්කරතාවය වන්නේ තමනට ලැබෙන තර්ජන පිළිබඳව පොලිසිය සහ හමුදාව ඇතුළු බලධාරීන් වෙත පැමිණිලි කිරීමට ඇති අපහසුවයි. එක් සිද්ධියක දී දෙමළ පුවත්පත් කාර්යාලයක් තුළට ඇතුළු වූ සන්නද්ධ පුද්ගලයන් දෙදෙනෙකු පොලිසියෙන් අල්ලා ගනු ලැබුවත් තමන් හමුදාවේ සාමාජිකයන් බව ඔවුන් විසින් හඳුන්වා දීමෙන් පසුව නිදහස් කර යවනු ලැබීය.

ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සන්නද්ධ හමුදා ඒකක තමනට ඇති විශාල අධිකාරීත්වය යටතේ සාමාන්‍යයෙන් මෙවැනි දේ සිදු කරන අතර ඒ

සම්බන්ධයෙන් තම කොළඹ මූලස්ථානවල සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට වග කියන්නේ අඩුවෙන් බව පෙනේ.

තත්ත්වය වඩාත් උග්‍ර වී ඇත්තේ දෙමළ සහ සිංහල ලෙස බෙදී ඇති මාධ්‍ය ක්‍රියාකාරිකයන් වෙත මාධ්‍ය හිමිකරුවන් විසින් හෝ අවිධිමත් ආරක්ෂක ජාලයක උපකාරයෙන් හෝ ලැබිය යුතු අවදානම් පිළිබඳ දැනුවත්කම සහ ආරක්ෂක පුහුණුව පිළිබඳ සැහැල්ලු ක්‍රමවේදයන්හි මඳකම නිසාය. බොහෝ දෙමළ මාධ්‍ය ක්‍රියාකාරිකයෝ ගමන් බිමන් යන්නේ අත් අඩංගුවට පත්වීමේ අවදානම සහිතවය. අත් අඩංගුවට ගැනෙන්නන් රඳවා තබනු ලබන්නේ කොතැනද යන්න පිළිබඳව මෙතරම් අවදානමක් තිබියදී පවා ඔවුනගේ මිතුරන්ට හෝ පවුලේ අයට බොහෝ විට දැනුම් දීමක් නොකෙරේ.

මාධ්‍ය ක්‍රියාකාරිකයන් තුළ ඇති වී තිබෙන දිගු කාලීන ක්ෂතික තත්ත්වය සහ මානසික ආතතියේ බලපෑමද සැලකිය යුතු කරුණකි. විශේෂයෙන් මනෝ විද්‍යාත්මක බලපෑම් - PTSD වලට මැදිහත් වීම සඳහා විධිමත් උපකාරක ව්‍යුහයක් නොමැත. (දූත මණ්ඩලය විසින් සම්මුඛ සාකච්ඡා කරන ලද මාධ්‍ය ක්‍රියාකාරිකයන් බොහෝ විට දෙවුර හකුළුවමින් කීවේ, ජනතාවගේ දැන ගැනීමේ අයිතිය සම්පූර්ණ කරන තම රාජකාරිය අතහැර දමන්නට තමනට නොහැකි බවයි.)

දූත මණ්ඩලය වෙත වාර්තා වූ කරුණු පදනම් කර ගනිමින්, ඝාතන සහ සෙසු සිද්ධීන් සම්බන්ධයෙන් ගැඹුරින් පරීක්ෂණ පැවැත්වීමට සමහර බලධාරීන් අකමැත්තක් දක්වනු ලබන බව සොයා ගන්නට ලැබීම ගැන ජාත්‍යන්තර දූත මණ්ඩලය තම දැඩි අවධානය යොමු කරයි. ඕනෑම පරීක්ෂණයක් පිළිබඳව ජනතාව අතර වූ වාර්තාවන් සලකා බැලූ කල්හි ඒවායින් කියැවෙන්නේ සමහර සිද්ධි වලදී ඝාතකයන් ලෙස සැලකෙන අයගේ අනන්‍යතාවයන් හෙළි කර දී තිබූ බවය. එසේ නැතහොත් ඒවා හෙළිකර ගැනීමට උපකාර වන තොරතුරු ලබා දී තිබූ බවය. එහෙත් අදාළ බලධාරීන් බොහෝ විට ක්‍රියා මාර්ග ගෙන නැත. එසේත් නැත්නම් ක්‍රියා මාර්ග ගෙන ඇත්තේ ඉතා අඩුවෙනි. උදාහරණයක් ලෙස ධර්මරත්නම් සිවරාම් සිද්ධියෙහිදී පොලිසිය එල්.ටී.ටී.ඊ. විරෝධී සංවිධානයක කාඩර්වරයකු අත් අඩංගුවට ගත් බව වාර්තා වූ නමුත් එතැනින් එහාට එහි වර්ධනයක් ගැන වාර්තා වුයේ නැත. සුරේෂ්කුමාර් සහ රංජිත් කුමාර් සිදුවීමේ දී එක් සැකකාර ප්‍රහාරකයකුගේ නම පොලිසියට ලබා දී තිබුණද ඒ පිළිබඳ පියවරක් ගැණුනු බවක් පෙනෙන්නට නැත.

මේ ආකාරයෙන් ගත් කල මේ තත්ත්වය මූලික අයිතිවාසිකම් සම්බන්ධව බලපාන්නා වූ මුක්තියේ සංස්කෘතියක් ඇති වටපිටාවක් ගොඩ නැඟීමක් ලෙස සැලකිය හැකිය. ජාත්‍යන්තර දූත මණ්ඩලයේ අවධානයට යොමු කරවනු ලැබූ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කෙරුණු සිද්ධීන් ගණනාවක් සම්බන්ධයෙන් බලධාරීන් ප්‍රමාණවත් පියවර ගෙන තිබුණු බවක් පෙනෙන්නට තිබුණේ නැත.

ඒ මඟින් තොග ගණනේ සිදුවන මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් පියවර ගැනීමට රජයට ඇති හැකියාව සහ කැමැත්ත පිළිබඳව වූ විශ්වාසය අර්බුදයට යමින් තිබේ.

මාධ්‍ය ක්‍රියාකාරිකයන් ඝාතනය කිරීමේ ප්‍රශ්නය ආණ්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා හමු වූ අවස්ථාවෙහිදී ඉදිරිපත් කරනු ලැබිණි. ගත වූ මාස 18 තුළ මාධ්‍ය ක්‍රියාකාරිකයන් 9 දෙනෙකු තරම් පිරිසක් ඝාතනය කරනු ලැබ ඇතැයි යන කරුණට ඔහු එකඟ නොවීය. නමුත් තමන් දන්නා පරිදි අවම වශයෙන් දෙදෙනෙකු ඝාතනය වී ඇති බව ඔහු පිළිගත්තේය.

මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ අභාවයන් පිළිබඳවත් හඳුනාගැනීම් හා සිදුවීම් පිළිබඳවත් අමතර තොරතුරු සැපයීමට ජාත්‍යන්තර දූත මණ්ඩලය කටයුතු කරනු ලැබීය. එම තොරතුරු 2006 ඔක්තෝබර් 25 දිනැතිව ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය විසින් සපයනු ලැබිණි. (කරුණාකර ඇමුණුමක් ලෙස ඇති "ශ්‍රී ලංකාවේ මාධ්‍ය සේවකයන්ට එරෙහි

ප්‍රහාර සඳහා වු මුක්තිය අහෝසි කරන ලෙස ඉල්ලමින් දකුණු ආසියානු කර්තෘවරුන්ගේ දූත මණ්ඩලයේ ලිපිය කියවන්න.)

ආරක්ෂක ප්‍රකාශක වරයා ජාත්‍යන්තර දූත කණ්ඩායම වෙත ප්‍රකාශ කරනු ලැබුවේ සියළුම චෝදනාවන් පිළිබඳව හොඳින් පරීක්ෂණ සිදුකෙරෙනු ඇති බවය. ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කොට සිටියේ මේ සියලු කරුණු පිළිබඳව අදහස් හුවමාරු කරගැනීමට තමන් විවෘත බවත්, තමනට කළ හැකි සියලු දේ ඉටු කිරීමට තමන් සූදානම් බවත් ය. එම සිදුවීම් පිළිබඳව සොයා බැලීම හැරුණු කොට අදාළ පැමිණිලි හොඳින් පරීක්‍ෂනයට ලක් කරනු ලබන බවත් සෑම පැමිණිල්ලකම පරීක්‍ෂණයන් පිළිබඳව සුදුසු පරිදි පසු විපරම් කරන බවත් ඔහු වැඩිදුරටත් පැවසුවේය.

ඉන් අදහස් කරන්නේ සැලකිල්ලට ලක් වූ සිදුවීම් පිළිබඳ පරීක්‍ෂකයන්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රගති වාර්තාවක් තිබිය යුතු බවය.

ජාත්‍යන්තර දූත මණ්ඩලය තම බලවත් අවධානය යොමු කරනු ලබන්නේ නීති විරෝධී ලෙස ඝාතනයන් සිදු කරන (සහ වෙනත් හිංසාකාරී තර්ජනයක් සිදු කරන) පුද්ගලයන් වෙත ලැබී ඇති බව පෙනෙන මුක්තිය කෙරෙහිය. විශේෂයෙන් "වෛරී භාෂාව" විසින් පුද්ගලයන් ඉලක්ක කරනු ලැබීම. හිංසාව සඳහා වූ පෙළඹවීමක් ලෙස ජාත්‍යන්තර දූත මණ්ඩලය සලකයි. අදාළ බලධාරීන් දේශපාලනමය පෙළඹවීමක් ඇති හිංසනයන් පරීක්‍ෂාවට ලක් නොකරනු ඇතැයි පවතින මතය එවැනි අපරාධමය ක්‍රියාකාරකම්වල නියුක්ත වූවන් දිරිගන්වන්නකි.

එවැනි ක්‍රියාකාරකම් මාධ්‍යවේදීමය සහ මාධ්‍ය ප්‍රජාව වෙත පමණක් සීමා වූවක් නොවන බව කිව යුතු නමුත් මාධ්‍ය ක්‍රියාකාරිකයන් දේශපාලන වෙනස්කම්වලට සම්බන්ධ විස්තර වාර්තා කිරීමේදී තම කාර්යයේ යුතුකමක් ලෙස ඉහළම තත්ත්වය අත්පත් කරගත යුතුය. බොහෝවිට විවාදාපන්න කරුණු වාර්තා කිරීමේදී බොහෝදුරට පෙනුමෙන්ම පැහැදිළිව තිබීම අවශ්‍යය. ප්‍රතික්‍රියාව මාධ්‍ය ක්‍රියාකාරිකයා වෙත අනවසරයෙන් පැමිණෙන බව විශ්වාස කරද්දී මෙය දේශපාලන හිංසනයෙහි යෙදීමට සම්බන්ධ වූවන් හට ශක්තිමත් දිරිගැන්වීමක් විය හැකිය.

දේශපාලන හිංසාකාරී ක්‍රියා මුලිනුපුටා දැමීම හෝ අවම කිරීම සිදු කළ හැක්කේ ඕනෑම දේශපාලන හිංසාකාරී සිද්ධියක් ගැන ශක්තිමත් සහ ප්‍රමාණවත් පරීක්ෂණ පැවැත්වීම මඟින් මුක්තිය ඉවසා සිටීමේ සංස්කෘතියක් ඇතැයි කෙරෙන ඕනෑම යෝජනාවක් ප්‍රතික්ෂ්පවන තැනට අධිකාරීන් විසින් ක්‍රියා කිරීමෙන් පමණකි.

උතුරු සහ නැගෙනහිර මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන වෙත එල්ල වන ප්‍රහාර හෙළා දකිමින් කරන්නේ යැයි යන චෝදනාව සම්බන්ධයෙන් කිසිදු කණ්ඩායමක් හෝ පුද්ගලයෙකු විසින් මාධ්‍යවෙත ප්‍රහාර එල්ල කිරීම පිළිගත නොහැකි බවට ආණ්ඩුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ අනූෂ පැල්පිට මහතා කරන ලද ප්‍රකාශය[7] ජාත්‍යන්තර දූත මණ්ඩලය අගය කරයි. මෙම සිද්ධීන් පිළිබඳව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ඉල්ලීම පරිදි පොලිස්පති වරයා යටතේ සිදුවෙතැයි වාර්තා වන ප්‍රබල පරීක්‍ෂණ වල ප්‍රගතිය පිළිබඳව "හැකිතාක් ඉක්මනින්" දැන ගැනීමට ජාත්‍යන්තර දූත මණ්ඩලය අපේක්‍ෂා කරයි.

ඊට අමතරව 2006 දෙසැම්බර් 23 වැනිදා එක්සත් ජාතීන්ගේ ආරක්‍ෂක මණ්ඩලය විසින් පිළිගන්නා ලද අංක 1738 දරණ යෝජනාව එහි ශ්‍රී ලංකාවට ඇති අදාළත්වය හුවා දක්වමින් ජාත්‍යන්තර දූත මණ්ඩලය අගය කරයි. මෙම සංදර්භය තුළ පෙර කී යෝජනාවෙහි මාධ්‍ය ක්‍රියාකාරිකයන්ට එරෙහි ප්‍රහාරයන් හෙළා දැකීම ඇතුළත් වේ. එවැනි හිංසාකාරී ක්‍රියාවන්හි නියුක්ත වන්නන් ජාත්‍යන්තර නීතියට අනුකූලව අධිකරණය ඉදිරියට ගෙන ඒම, ජාත්‍යන්තර නීතිය යටතේ මුක්තිය අවසන් කිරීමට රාජ්‍යයන්ට ඇති අදාළ යුතුකම ඉටුකිරීමේ වගකීම අවධාරණය කිරීම සහ මාධ්‍ය වෘත්තිකයන්ගේ වෘත්තීය ස්වාධීනත්වයට සහ අයිතිවාසිකම්වලට ගරු කිරීමත් ඒ තුළ අවධාරණය කරනු ලැබ තිබේ.

7. කරුණාකර ඇමුණුම 3 කියවන්න. උතුරු නැගෙනහිර මාධ්‍ය නිදහස මර්ධනය කිරීමට දරණ ප්‍රයත්න පිළිබඳව ආණ්ඩුව කණස්සල්ල පළකරයි. ආණ්ඩුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ අනූෂ පැල්පිට මහතා විසින් නිකුත් කළ නිවේදනය - 2006 ඔක්තෝබර්

# 3 වාරණය

ශ්‍රී ලංකාවේ වාරණය සම්බන්ධයෙන් සැලකූ කල මාධ්‍ය සම්බන්ධ වන ආකාරය, ඔවුන්ගේ භාෂාව සහ ඔවුන්ගේ භූගෝලීය ස්ථානය යන කරුණු වශයෙන් විවිධ ලෙස අයිතීන් උල්ලංඝනය වීම් සහිත අතිශයින් සංකීර්ණ මාධ්‍ය වාතාවරණයක් ඇති බව ජාත්‍යන්තර දූත මණ්ඩලයට සොයා ගැනීමට හැකිවිය. මෙම වාරණයේ මෙහෙයුම් කරුවන් ආණ්ඩුව, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සහ ප්‍රජානායකයන්ගේ සිට සන්නද්ධ හමුදාවන් දක්වාත් එල්.ටී.ටී.ඊ.ය සහ සෙසු සන්නද්ධ කල්ලි දක්වාත් පුළුල් ලෙස පැතිර තිබේ.

මාධ්‍යවල පවතින ප්‍රධාන ප්‍රශ්නය ආරක්ෂක කරුණු සම්බන්ධ ස්වයං වාරණයයි. මාධ්‍ය ආයතනවලට ලැබෙන ප්‍රවෘත්ති, ප්‍රකාශයට පත් කිරීමට පෙර ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය වෙතින් සහතික කරවා ගන්නා ලෙස ඉල්ලමින් පසුගිය සැප්තැම්බරයේදී ආරක්ෂක අමාත්‍යංශය විසින් මාධ්‍ය ආයතන වෙත යවනු ලැබූ ලිපිය හේතුවෙන් මෙම තත්ත්වය තවත් උග්‍ර අතට හැරී තිබේ. ජාත්‍යන්තර දූත මණ්ඩලයට දැනගන්නට ලැබී ඇති පරිදි, ආණ්ඩුව පිළිබඳව විවේචනාත්මක අදහස් ඇති මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ ගමන් බිමන් ආදිය රාජ්‍ය ආරක්ෂක නියෝජිතයන් විසින් නිරන්තරයෙන් නිරීක්ෂණය කෙරෙයි. ජාත්‍යන්තර දූත මණ්ඩලය සම්මුඛ සාකච්ඡාවන් පවත්වනු ලැබුවේ මෙම පසුබිම තුළය.

පුද්ගලික අංශයේ සමහර මාධ්‍ය ක්‍රියාකාරිකයන් කීවේ "භීෂණයෙන් යුත් වාතාවරණයක්" ඇතිබවත් "වෛරය සෑම තැනම පැතිරී ඇති" බවත් ය. පුද්ගලික ගුවන් විදුලි සහ රූපවාහිනී ආයතන වලට ප්‍රවේශමෙන් කටයුතු කරන ලෙස සහ LTTE සංවිධානය වෙනුවෙන් ගුවන් කාලය නොදෙන ලෙසත් අවවාද කරනු ලැබ තිබේ. රාජ්‍ය මාධ්‍ය කිසිසේත්ම ආණ්ඩුව විවේචනය කිරීමෙන් වැළකී සිටියි. මාධ්‍ය ක්‍රියාකාරිකයන් කීවේ, ප්‍රවෘත්ති සමබර කිරීමේ සහ තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවයක් මතු වී ඇති බවත් ලිවීමේ දී අවිධිමත් පාලනයක් පවතින බවත් ය.

මෙම පාලනයන් නොතකා හරිනු ලබන අය කෙරෙහි වූ අවදානම වඩාත් උත්සන්න කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, මාධ්‍යවල සමහර කොටස් සහ සමහර ප්‍රජා නායකයෝ මාධ්‍ය ක්‍රියාකාරිකයන් "ද්‍රෝහීන්" හෝ "ඔත්තුකරුවන්" ලෙස හඳුන්වමින් ඔවුන්ගේ ජීවිත අනතුරෙහි හෙළීමට කටයුතු කර තිබේ.

සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාමය මාධ්‍ය අතර බෙහෙවින් වෙනස් අත්දැකීම් ඇති බව සොයාගන්නට ජාත්‍යන්තර දූත මණ්ඩලයට හැකියාව ලැබිණි. ඉංග්‍රීසි සහ සිංහල භාෂාමය මාධ්‍යවල සාමාජිකයන් LTTE යේ බිය ගැන්වීම් සහ තර්ජන ගැන කථා කරනු සමඟම ආණ්ඩුවේ දැක්ම කෙරෙහි කීකරුවීම සඳහා වූ බලපෑම් (විශේෂයෙන් වඩාත්ම ජ්‍යෙෂ්ට සිංහල සහ ඉංග්‍රීසි භාෂාමය මාධ්‍ය අතර පවා ස්වයං වාරනයක් ඇති කිරීමට තුඩු දී තිබෙන නව ත්‍රස්ත විරෝධී රෙගුලාසි හඳුන්වාදීම ඇතුළුව) පිළිබඳව ද කථා කරති. එහෙත් සිංහල සහ ඉංග්‍රීසි භාෂාමය මාධ්‍ය මුහුණ දෙන්නේ එළිපිටම වඩාත් බලවත් දුෂ්කරතාවනට නිරතුරුව මුහුණ දෙන දෙමළ භාෂාමය මාධ්‍ය මුහුණ දෙන වාතාවරණයට වඩා සාපේක්ෂව සිරවීමෙන් හා අවදානමෙන් අඩු තත්ත්වයකටය.

එක්තරා දෙමළ මාධ්‍ය ක්‍රියාකාරිකයකු විස්තර කළ අන්දමට දිවයින බෙදී ඇත්තේ වක්‍ර වාරණය පුළුල් ලෙස ක්‍රියාත්මක වන දකුණ සහ මාධ්‍ය පාලනය කිරීම් ඍජු සහ විවෘත ලෙස ක්‍රියාත්මකවන උතුර-නැගෙනහිර වශයෙනි. එම තත්ත්වය වැඩිදුරටත් විස්තර කළ ඔහු කීවේ "එය හරියට රටවල් දෙකක ප්‍රකාශනය කිරීම වැනි" බවය.[8]

මෙය ශ්‍රී ලංකා මාධ්‍ය ක්ෂෙත්‍රයෙහි ධ්‍රැවීකරණය වීමක් ලෙස හඳුන්වන පෙර කී මාධ්‍ය ක්‍රියාකාරිකයා වැඩි දුරටත් කීවේ. "දෙමළ මාධ්‍ය දෙමළ සාක්ෂි සොයද්දී සිංහල මාධ්‍යන් කරන්නේත් එයම බවය." තවත් මාධ්‍ය සේවකයකු ප්‍රකාශ කළේ මාධ්‍ය ක්ෂෙත්‍රය තුළ සමගියක් නැති බවත් මෙම ධ්‍රැවීකරණය මඟින් මාධ්‍ය කර්මාන්තයේ සියලු අංශ දුර්වල කර ඇති බවත්ය.

8. මේ කරුණ පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා "ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර මාධ්‍ය පිළිබඳ අධ්‍යයනය" විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගීතාවය 2003 ජුනි ප්‍රකාශනය කියවන්න.-

තත්ත්වය විස්තර කරමින් තවත් මාධ්‍ය ක්‍රියාකාරිකයකු ප්‍රකාශ කළේ වැරදි සිදුවීම් බොහෝ දුරට සිදුවන්නේ ගැටුම් පිළිබඳ තොරතුරු දෙමළ මාධ්‍ය විසින් ගැටුම් භූමියේ සිටම වාර්තා කරන කල සිංහල මාධ්‍ය ඒවා බොහෝ විට අසා දැනගැනීමෙන් වාර්තා කරන නිසා බවය. මාධ්‍ය ක්‍රියාකාරිකයන් උතුරේ සහ නැගෙනහිර සිට වාර්තා කිරීමේ දී ගැටුම් ප්‍රදේශ වල සිටින එල්.ටී.ටී.ඊයේ හෝ ආණ්ඩුවේ අදහස් තුළම සිටිමින් ක්‍රියා කරන ආකාරයෙන් පෙනෙන්නේ, ගැටුම් පාර්ශව දෙකම තම පාලනය පවතින ප්‍රදේශවල සිදුවීම් වාර්තා කරණයේදී අනම්‍ය තිරිංගයක් පවත්වාගෙන යනු ලබන බවය.

කෙසේනමුත් දැනට පවත්නා ප්‍රශ්න වලට පිළිතුරු සෙවීම සඳහා වෘත්තියමය වෘත්තීය සමිති හරහා ඉහළ තනතුරු දරන්නවුන්ගේ ඒකාබද්ධ තාවයක් වර්ධනය වීම පෙනෙන්නට ඇති කරුණකි.

උතුරු නැගෙනහිර වෙසෙන දෙමළ වාර්තාකරුවන් විශේෂයෙන් යාපනයේ වාසය කරන අය, බලධාරීන් විසින් තොරතුරු සහතික කිරීම ප්‍රතික්ෂේප කිරීමේ පටන් විවිධාකාර පීඩාවන් ගණනාවකට මුහුණ දෙති. ඒ අතර දෙමළ පුවත්පත්වල සංස්කරණ ප්‍රතිපත්තිවලට ඇඟිලි ගැසීම, පොලිස් සහ හමුදා නිලධාරීන් මැදියම් රාත්‍රියෙහි ප්‍රවෘත්ති කාමර වෙත පැමිණීම. දුරකථන මඟින් එන හිංසාකාරී තර්ජන සහ කායික පහරදීම් හා ඝාතන ආදිය ඒවායි.[9] උතුරු නැගෙනහිර මුද්‍රිත මාධ්‍ය බෙදාහැරීම වැළැක්වීම බලවත් මාධ්‍ය නිදහස උල්ලංඝනය කිරීමක් වන අතර තර්ජන මගින් සහ තොරතුරු සීමා කිරීම මඟින් වැඩිදුරටත් එම ප්‍රදේශවල ජනතාව අතර අනාරක්ෂිතභාවය ඉහළ නංවනු ලබයි. මෙම සංදර්භය තුළ "කරුණා පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන සන්නද්ධ කණ්ඩායම වැනි කණ්ඩායම් විසින් "වීරකේසරී", "තිනක්කුරල්" සහ "සුඩර්ඔලි" යන පුවත්පත් ද ඇතුළුව ස්වාධීන දෙමළ භාෂාමය පුවත්පත් බෙදාහැරීම වළක්වනු ලැබ ඇති බව ජාත්‍යන්තර දූත මණ්ඩලයට දැනගන්නට ලැබිණි. දිවයිනේ නැගෙනහිර ප්‍රදේශයේ පවා රාජ්‍ය මාධ්‍ය නොමැත.[10] ගැටුම්කාරී ප්‍රදේශවල දී රූපගත කරනු ලබන වීඩියෝ පටවල පිටපත් හමුදාවට ලබාදෙන ලෙස ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය වලට බල කරනු ලැබ තිබේ.

ජාත්‍යන්තර දූත මණ්ඩලය විසින් සොයා ගත් කරුණු වලට අනුව මාධ්‍ය නිදහස බරපතල ලෙස උල්ලංඝනය කිරීමේ සිද්ධීන් ගණනාවකට එල්.ටී.ටී.ඊ. සංවිධානය වරදකරු වෙයි. එල්.ටී.ටී.ඊ පාලන ප්‍රදේශ වලදී මාධ්‍ය නිදහස බලවත් ලෙස සීමා කරනු ලැබ ඇති අතර මාධ්‍ය ක්‍රියාකාරිකයන් පැහැර ගෙන යාම, මාධ්‍ය ක්‍රියාකාරිකයන් ඝාතනය කිරීම, දෙමළ පුවත්පත් වලට බලපෑම් එල්ල කිරීම මෙන්ම රාජ්‍ය පාලිත මාධ්‍යවල සේවය කරන මාධ්‍ය ක්‍රියාකාරිකයන් හට තම රැකියා වලින් ඉවත්වීම සඳහා බල කිරීම ද එම සංවිධාන විසින් සිදුකරනු ලැබ තිබේ.

ඒ අතරතුරම යාපනයේ සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර කටයුතු කරන මාධ්‍ය ක්‍රියාකාරිකයන්හට තම ප්‍රවෘත්ති සැකසීමේදී සහ ආයතන වෙත යැවීමේදී සැලකිය යුතු තරමේ දුෂ්කරතාවයන් රැසකට මුහුණ දෙන්නට සිදු වී තිබේ. යාපනයේ සිට කොළඹ දක්වා වූ ප්‍රවාහණ සේවාවන් ගැන බලාපොරොත්තු තැබිය නොහැකි අතර ඒවා විධිමත් ආකාරයකට සිදු නොවේ. ජංගම දුරකථන පහසුකම් නැති අතර සෘජු (රැහැන්) දුරකථන සේවාවන්ද විසන්ධි කර ඇත. ඉන්ටර්නෙට් කැෆේ මඟින් ප්‍රවෘත්ති යැවීම ද වළක්වනු ලැබ තිබේ.

මෙම වාතාවරණය තුළ වාර්තාකරණය පිළිබඳව කථා කළ දෙමළ මාධ්‍ය ක්‍රියාකාරිකයකු පැවසුවේ තමනට ආණ්ඩු හතරකට කීකරු වන්නට සිදු වී ඇති බවය. එනම්; ආණ්ඩුව, එල්.ටී.ටී.ඊ. ය, අතුරු හමුදාවන් හා සන්නද්ධ කල්ලි සහ විවිධ රාජ්‍ය නොවන සංවිධානවල මාධ්‍ය නිලධාරීන් යන

9. නොවැම්බර් 6 වැනිදා යුද හමුදාවේ 512 වැනි කොට්ඨාසයේ නිලධාරීන් යාපනයේ පළවන උදයන්, යාල් තිනකුරල් සහ වාලම්පුරි දෙමළ පුවත්පත්වල කතුවරුන් කැඳවා දෙමළ කොටි සංවිධානයේ පුවත් පළ නොකරන ලෙසත්, එල්.ටී.ටී.ඊ. නායකයාගේ විරුදින පණිවුඩය පළ නොකරන ලෙසත් ඉල්ලා ඇතැයි වාර්තා විය.

(Army tries to force tamil press in to self sensorships, RSF 9 Nov 2006)

9. එල්.ටී.ටී.ඊ.යෙන් බිඳී ගිය කරුණා කණ්ඩායම නම් අතුරු හමුදා කණ්ඩායම විසින් වීරකේසරී පුවත්පත් පිටපත් 10,000 ක් ඔක්තෝබර් 22දා මඩකලපුවේදී ගිනිතබන ලදී.

(Ibid)

ඒවාය. මෙම තත්ත්වය ගැනම විග්‍රහ කරමින් තවත් සම්මුඛ සාකච්ඡාකරුවකු කිවේ ජනතාව සමාජයේ කණස්සල්ල නිරූපනය කෙරෙන හුදකලා අංශ වලට බෙදී යමින් පවතින බවයි. ඒ අනුව අවම වශයෙන් එකකට එකක් වෙනස් ශ්‍රී ලංකාවන් හතරකට සමාජය බෙදී ඇතැයි මෙම සම්මුඛ සාකච්ඡාකරු කියයි. එම බෙදීම් හතර නම්, රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලික අංශය; සිංහල මාධ්‍ය පාඨකයන් සහ එයට ලැදි අය; දෙමළ මාධ්‍ය පාඨකයන් හා එයට ලැදිඅය; ආණ්ඩුවේ ආධාරකරුවන් හා ඉහත අංශ තුනටම අයත් නොවූවන් වශයෙනි.

මෙම අදහස් සෑම විටම ආණ්ඩුව පිළිගන්නේ නැත. ජන සන්නිවේදන සහ තොරතුරු අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා අවධාරණය කළේ ගැටළු සහගත අවස්ථා වලදී සහ අභියෝගාත්මක අවස්ථාවන් හිදී අමාත්‍යාංශය වෙත යොමු වන ලෙස මාධ්‍ය ක්‍රියාකාරිකයන් දිරි ගන්වනු ලැබ ඇති බවයි. අමාත්‍යවරයා වැඩි දුරටත් ප්‍රකාශ කළේ මාධ්‍ය අමාත්‍යාංශය මාධ්‍ය ක්‍රියාකාරිකයන් හට සෑම අවස්ථාවකම විවෘත බවත් තම නිවසේදී පවා තමන් හමුවිය හැකි අතර තම දුරකථන අංකය ඔස්සේ වුවත් හැම දෙනෙකුටම නිදහසේ තමන් ඇමතිය හැකි බවත්ය. මාධ්‍ය අමාත්‍යාංශය මාධ්‍ය ක්‍රියාකාරිකයන් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ව්‍යාපෘතියක් ද ස්ථාපිත කර තිබේ. ආරක්ෂක අමාත්‍යාංශයද මාධ්‍ය ක්‍රියාකාරිකයන් සඳහා හදිසි කරුණු සම්බන්ධව ඉක්මන් ප්‍රතිචාර දැක්වීමේ දුරකථන අංකයක් විවෘත කර තිබේ. එම අංකය වෙත ලැබෙන සියලුම ඇමතුම් පටිගත කෙරෙයි.

ජාත්‍යන්තර දූත කණ්ඩායම විසින් සිදු කරන ලද ඇතැම් නිරීක්ෂකයන්ට ඇතුළත් වූ කරුණු අතර දෙමළ මාධ්‍ය පාඨකයන් සහ එයට ලැදියාවක් ඇත්තවුන් තුළ සමානයන් ලෙස නොසැලකීමක් ඇති බවත් "දෙවැනි පංතියේ" පුරවැසියන් ලෙස සැලකෙතැයි ඇති හැඟීම මෙන්ම මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ පීඩිත ජීවන තත්ත්වය සහ ප්‍රමාණවත් නොවන ආදායමත් තමන් "තර්ජනයට ලක් වූ විශේෂයක්" ලෙස සැලකෙන බවට වූ හැඟීමත් තිබේ.

අනෙක් ප්‍රශ්නය නම් මාධ්‍ය ක්‍රියාකාරීන් සමහර දෙනෙකු තුළ ඇති අඩු වෘත්තීයභාවයයි. මේ සමඟම විවිධ දේ ලබා ගැනීමට ඇති ප්‍රශ්න, පුරවැසිභාවයේ ඇතුළත් වීම් සහ පුද්ගලිකවත් මාධ්‍ය වෘත්තීයමය වශයෙනුත් ඇති අයිතිවාසිකම් පිළිබඳව ඇති අඩු දැනුවත් භාවයද තිබේ. මේ සියල්ලෙහි බලපෑම නිසා මාධ්‍ය දුර්වල වී තිබේ.

වෘත්තීයමය ජන මාධ්‍යවේදී තල තුළ වංචා දූෂණමය සහ ආචාර ධර්මීය නොවන භාවිතාවන් තිබීමද දකින්නට ලැබිණි. එසේම ඔවුනගේ සෑම ක්‍රියාකාරකමක් තුළම "ආවේනික භීතියක්" ව්‍යාධියක් මට්ටමට ව්‍යාප්ත වී තිබේ. නාඳුනන්නන්ගේ තර්ජනාත්මක දුරකථන ඇමතුම් සහ ගැටුම්කාරී දෙපාර්ශ්වයෙහිම හිංසාවන්ට ලක් වීමේ අවදානම් අවස්ථාවන්ද නිරීක්ෂණය කෙරිණි. එසේම දුරකථන ඇමතුම් ආදිය නිල වශයෙන්ම නිරීක්ෂණය කරනු ලැබීමේ පීඩනය මාධ්‍යවේදීන් මත යොදනු ලැබ ඇති අතර සමහරුන්ගේ විශ්වාසය වන්නේ එසේ කරනු ලබන්නේ "රාජ්‍යයේ නියෝජිතයන්" බවයි.

# 4 මාධ්‍ය ප්‍රතිපත්ති පරිසරය

ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ නෛතික රාමුවත් මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස කෙරෙහි වූ ඒවායේ බලපෑමත් සම්බන්ධයෙන් බාධාකාරී තත්ත්වයක් පැන නැඟී ඇති බව ජාත්‍යන්තර දූත මණ්ඩලයේ සොයා ගැනීමයි. මාධ්‍ය නිදහස යනු, රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් සාධකයක් බව ආණ්ඩුව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරතත් ස්වාධීන බහුත්වවාදී මාධ්‍යයක් පැවැතීම සඳහා සුදුසු වූ නෛතික වටපිටාවක් නිර්මාණය කිරීමෙහි ලා ආණ්ඩුව විසින් සිදු කරනු ලැබ ඇති කාර්යය ඉතා සුළුය. සත්‍ය වශයෙන්ම දැනට ගැනී ඇති නෛතික පියවරයන් නැඹුරු වී ඇත්තේ අත්‍යන්තයෙන්ම එහි විරුද්ධාර්ථය වෙතය.

දැනටමත් සක්‍රීය සංවාදයක් පවතිතත්, ඵලදායී නිල නිර්දේශ රාශියක් තිබියේ වී නමුත්, ආණ්ඩුව තවමත් රාජ්‍ය ගුවන් විදුලි සේවාවන් සංස්කරණ ස්වාධීනත්වය සහතික කරනු ලැබූ සැබෑ මහජන සේවා ගුවන් විදුලි සේවාවන් බවට පරිවර්තනය කිරීම සඳහා පියවර ගෙන නැත. උදාහරණයක් ලෙස 1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතට අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පාලක මණ්ඩලයේ සියලුම සාමාජිකයන් පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. මෙම තත්ත්වය ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි බව මෙන්ම රාජ්‍ය ගුවන් විදුලි සේවාවන් පක්ෂග්‍රාහී මාධ්‍ය ආවරණයන්ට නැඹුරු වීමට හේතු වන බවටත් පුළුල් ලෙස හඳුනා ගෙන තිබේ.

වාණිජමය සහ ප්‍රජා ගුවන් විදුලි සේවාවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය සහිත ස්වාධීන විකාශන අධිකාරියක් පිහිටුවීම සඳහා වූ නීති ප්‍රතිපාදන ස්ථාපිත කිරීමට තවමත් ආණ්ඩුව අපොහොසත්ව සිටියි. ඒ වෙනුවට දැන් එය සිදු කෙරන්නේ සෘජුවම අමාත්‍යවරයා විසින් හෝ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ඔස්සේය.

එසේම තොරතුරු ලබා ගැනීමේ හෝ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය පිළිබඳව වූ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට පවා ඇතුළත් කොට තිබියදීත්, එය සම්මත කිරීම අඛණ්ඩව ප්‍රමාද වෙමින් තිබේ. නිදහස් තොරතුරු පනත සම්බන්ධයෙන් විශාරදයන් පිරිසක් මේ වන විටත් කටයුතු කරමින් සිටින බව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා අවධාරණය කරන ලද නමුත් 2002 සිට ක්‍රියාත්මක වෙමින් තිබූ එම ක්‍රියාවලියෙහි සතුටුදායක ප්‍රතිඵල තවමත් දකින්නට නැත.

ඒ අතරතුර ආණ්ඩුව අවධාරණය කළේ පුවත්පත් මණ්ඩලයක් නැවත හඳුන්වා දීමේ අවශ්‍යතාවය පිළිබඳවය. ජාත්‍යන්තර දූත මණ්ඩලයේ සංචාරයට පෙර ආණ්ඩුව තර්ජනය කර සිටියේ ව්‍යවස්ථාපිත පුවත්පත් මණ්ඩලයක් නැවත ඇති කරන බවටය. ආණ්ඩුව, තමන් මාධ්‍ය වාරණයට විරුද්ධ බවත් මාධ්‍ය ක්‍රියාකාරීන් විසින්ම තම චර්යාවන් නියාමනය කිරීමේ තත්ත්වයක් බිහි කර ගනු ලැබීමට වඩා කැමැති බවත් ප්‍රකාශ කරන අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රකාශකයකු සඳහන් කළේ තම අමාත්‍යාංශය විසින් පුවත්පත් මණ්ඩලයක් පිහිටුවීම සඳහා මහජන ආයාචනයක් කරන ලද බවය.

කෙසේ නමුත් ජාත්‍යන්තර දූත මණ්ඩලය දැනට ඇති ස්වයං නියාමන පියවරයන්හි දුර්වලකම් පෙනෙන්නට ඇති බව සඳහන් කරයි. එය සිදු වී ඇත්තේ වෘත්තියෙහි සාමාජිකයන් විසින් නිර්මාණය කරනු ලැබූ පවත්නා ආචාර ධර්ම පද්ධතිය මාධ්‍ය ක්‍රියාකාරිකයන් විසින් නොතකා හරිනු ලැබ ඇති හෙයිනි. ගුණාත්මකභාවයේ ප්‍රමිතීන්හි සහ ආචාර ධර්මීය හා මාධ්‍යවේදීමය ප්‍රමිතීන් වෙත බැඳී සිටිම අතර වූ අසමානතාවන් පිළිබඳව ඒවාට ගැලපෙන සහ ඒකාබද්ධ ආකාරයකින් සැලකිල්ලට ලක් කොට නැත.

ආචාර ධර්ම පද්ධතියක බලපෑම සහ ප්‍රමිතීන් නැංවීමට ඇති ඉඩකඩ වෘත්තියෙහි අයිතීන් සහ වගකීම් පිළිබඳ පොදු දැනුවත් භාවය නැංවීම සහ වෘත්තීය භාවය වර්ධනය කිරීම යන සියලු කරුණු පවතින්නේ සාපේක්ෂව ප්‍රයෝජනයට නොගෙනය.

මෙම ව්‍යුහාත්මක කරුණු, පවත්නා වාරණය සහ අන්තර්ගතයන් පාලනය කිරීමේ ආකාර මඟින් උත්ප්‍රේරණය කරනු ලබයි. අගෝස්තුවේ ජනාධිපතිතුමා කර්තෘවරුනට කීවේ හමුදාව වාරණ රෙගුලාසි පනවන ලෙස සහ හදිසි නීති රෙගුලාසි ලෙස නව නීති පනවන ලෙස වාද කරමින් සිටින බවයි. එකී හදිසි නීති රෙගුලාසි ත්‍රස්තවාදය සහ විශේෂිත ත්‍රස්ත ක්‍රියාවන් වැළැක්වීමේ හදිසි නීති රෙගුලාසි ලෙස පසුව 2006 දෙසැම්බර්යේ දී පනවනු ලැබිණි. [11]

මාධ්‍ය ක්‍රියාකාරිකයන් තම සංස්කරණමය ක්‍රියාකාරකම් වෘත්තීයමය තත්ත්වයෙන් භාවිතාවෙහි යෙදූවීමෙන් වැළැක්වීමට පියවර ගැනීම ගැනද ජාත්‍යන්තර දූත මණ්ඩලය සඳහන් කරයි. "ආරක්ෂක කටයුතු" පිළිබඳව වාර්තා කිරීමටත් ගැටුමට සම්බන්ධ අනතුරුවල ප්‍රමාණයන් සහ දත්ත ආදිය පිළිබඳව නිශ්චිත භාවය පවත්වා ගෙන යාමටත් එරෙහිව තහනමක් පවත්වාගෙන යාම මඟින් මෙය සිදුවේ.

මෙම භීතියේ ව්‍යාධිය, ආණ්ඩුවේ විවිධ වාරණ ආකාර මඟින් තවදුරටත් වර්ධනය කරනු ලැබ තිබේ. සතිපතා කෙරෙන ප්‍රවෘත්ති සාකච්ඡා වලදී ජනාධිපතිවරයාගේ අවධාරණයන්, ජාතික විරෝධී යැයි සැලකෙන කරුණු ඇතුළත් ප්‍රකාශනයණට එරෙහිව වූ දැඩි දඬුවම් සහ ආණ්ඩුවේ හමුදා සහ අතුරු හමුදා විසින් කරන ලද පැහැර ගැනීම් සහ සමූල ඝාතනයන් පිළිබඳ වූ ප්‍රකාශනයන් තහනම බලවත් කිරීම ආදිය මෙන්ම ක්‍රියාකාරිකයන් වෙත හිංසා කිරීම සඳහා සංස්කරණ ප්‍රතිපත්තිය තීරණය කිරීම සඳහාත් ආරක්ෂක හමුදාවන් මැදිහත් වූ අවස්ථාවන් ගැන වාර්තාවන් ඉදිරිපත් වී තිබේ.

මේ සියල්ල සිදු වී ඇත්තේ මෑත මාස වලදී නැගෙනහිර ශ්‍රී ලංකාවේ අවම වශයෙන් පුද්ගලයන් 475 දෙනෙකු පැහැර ගෙන ගොස් ඇති බවට විශ්වාසයක් පවතින අතරතුරය. ඉහළ වෙළෙඳ දැන්වීම් බදු අඛණ්ඩව පවතියි. රාජ්‍ය මාධ්‍ය ආයතන නොකඩවාම පාලනය කෙරෙන්නේ මාධ්‍ය වෘත්තිකයන් අතින් නොව දේශපාලන වශයෙන් පත් කරනු ලැබූවන් විසිනි. අභිනවයෙන් පිහිටුවන ලද ජාතික ආරක්ෂාව සඳහා වූ මාධ්‍ය මධ්‍යස්ථානය මඟින් මිස ගැටුම්කාරී තත්ත්වය පිළිබඳව බැහැරින් තොරතුරු ලබා ගැනීම පාලනය කරනු ලැබ තිබේ.

මුළුමනින්ම ගත් කල මාධ්‍ය ක්‍රියාකාරිකයන් හට නිදහස්ව සහ වෘත්තීය ආකාරයෙන් ක්‍රියා කිරීමට අවස්ථාව ලබාදීම, මාධ්‍ය අතර සහයෝගීතාවයේ හැඟීම ප්‍රවර්ධනය කිරීම හා ගැටුම්කාරී කාලයන් හිඳී අවශ්‍ය වන විසඳුම් සඳහා දායක වීමට ඉඩකඩ සැලසීමත් ඒවා දිරිගැන්වීමත් සඳහා ප්‍රයෝජනවත් වන ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය රාමුවක් නැතිකම තීරණාත්මක කරුණක් ලෙස ජාත්‍යන්තර දූත මණ්ඩලය සටහන් කර තබයි.

ප්‍රජා මාධ්‍ය යන පුළුල් අර්ථයට ඇතුළත් සැබෑ මහජන සේවා ජනමාධ්‍ය ගුණ සහතික කිරීම පිණිස තමන්ගේම වූ යාන්ත්‍රණයන් නිර්මාණය කර ගැනීම ඇතුළුව, ක්‍රියා කිරීම සඳහා වූ ස්ථාවර සහ වෘත්තීයමය පරිසරයක් නිර්මාණය කර ගැනීම සඳහා මාධ්‍යවලට තමන් මතම වඩ වඩාත් යැපෙන්නට සිදු වී ඇති බව පෙනෙන්නට තිබේ.

මාධ්‍ය ප්‍රජාවද වැඩි දුරටත් ඒකාබද්ධ ආකාරයකින් වැඩ කිරීම, වෙනස්කම් වලින් ඔබ්බට ගමන් කිරීම, පවත්නා වෘත්තීයමය සහ ස්වයං නියාමන යාන්ත්‍රණ සහ තමනට අවශ්‍ය දේ කිරීම සඳහා වූ මෙවලම් ශක්තිමත් කිරීම ගැන සොයා බැලිය යුතුය.

11.කරුණාකර ඇමුණුම 2 බලන්න. "2006 හදිසිනීති රෙගුලාසි හඳුන්වා දීම" පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශණය සහ නව පියවරයන් පිළිබඳ ප්‍රකාශණය" නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

# 5 නිරීක්ෂණ සහ නිර්දේශ

ජාත්‍යන්තර දූත මණ්ඩලයේ සොයා ගැනීම් ද, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංවිධාන සමඟ වූ දීර්ඝ කාලීන ඒකාබද්ධ සබඳතාද මත පදනම්ව ජාත්‍යන්තර දූත මණ්ඩලය අවශ්‍යතාවය පරිදි පහත සඳහන් දෑ ඉටු කිරීම සුදුසු බවට ආණ්ඩුවට, ආරක්ෂක හමුදාවනට, එල්.ටී.ටී.ඊ. යට, දේශපාලන පක්ෂවලට, අතුරු හමුදා වලට හා සන්නද්ධ කණ්ඩායම් වලට පැහැදිලි ලෙසම නිර්දේශ කරයි.

රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ ආණ්ඩුවේ යුතුකම පරිදිත්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සහ අදාළ වන සෙසු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවත් මාධ්‍ය ක්‍රියාකාරිකයනට ආරක්ෂා සහිතව සහ ස්වාධීනව වාර්තා කළ හැකි විවෘත, විවිධත්වයෙන් යුත් සහ බහුත්වවාදී මාධ්‍ය පරිසරයක් ඇති කිරීම පිණිසයි.

---

ආතතීන් සහ අනාරක්ෂිතභාවය අවම කිරීමේ දී සහ විශ්වාසනීය සහ නිරවද්‍ය වූ තොරතුරු සැපයීමට කැප වූ මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ ධෛර්‍යය හා වෘත්තියමය භාවය ස්වාධීන, සාධාරණ, සමබර සහ නිරවද්‍ය වූ මාධ්‍යවේදයකට නිරූපණය කළ හැකි ප්‍රධාන සහ අත්‍යවශ්‍ය භූමිකාව හඳුනා ගැනීම.

මෙම ප්‍රතිපත්ති අන්තර්ගත වන නිදහස් මාධ්‍යයක් අර්ථවත් සහ කල් පවත්නා සාමයක් උදා කර ගැනීම උදෙසා ගැනෙන ඕනෑම ප්‍රයත්නයක වැදගත් සාධකයකි.

---

දෙමළ භාෂාමය මාධ්‍යයනට විශේෂයෙන් මුහුණදීමට සිදු වී ඇති නමුත් එයට පමණක් සීමා වී නැති, මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහසට බාධා පැමිණවීමත් එය වැළැක්වීමත් අරමුණු කර ගෙන සියලුම ගැටුම්කාරී පාර්ශ්වයන් විසින් මාධ්‍ය ක්‍රියාකාරිකයන්ට සහ කාර්යාලවලට එරෙහිව සිදු කරනු ලබන සියලුම තර්ජන, හිංසන, පැහැරගෙන යාම් සහ ප්‍රහාරයන් වහාම නැවැත්වීම.

---

මෙම සංදර්භය තුළ ජිනීවා ප්‍රඥප්තිය කෙරෙහි වූ තම වගකීම පිළිබඳව සියලුම ගැටුම්කාරී පාර්ශ්වයනට ජාත්‍යන්තර දූත කණ්ඩායම මතක් කර දෙයි.

---

මාධ්‍ය ක්‍රියාකාරිකයන් ඝාතනය කිරීම්, සහ මාධ්‍ය ක්‍රියාකාරිකයන් හටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හටත් එරෙහිව නිකුත් කෙරෙන මරණීය තර්ජන පිළිබඳව එවැනි ක්‍රියාවන් සම්බන්ධව මුක්තිය අවසන් කරමින් පරිපූර්ණ විනිවිද භාවයෙන් යුත් සහ කාලීන පරීක්ෂණ පැවැත්වීම. මෙම පරීක්ෂණ වලට, සුබ්‍රමනියම් සුගීර්ධරාජන්, සුරේෂ් කුමාර්, රංජිත් කුමාර්, ලක්මාල් ද සිල්වා, මරියදාස් මනෝජන්රාජ්, සතාසිවම් බාස්කරන් සහ සින්නතම්බි සිවමහාරාජා යන අයගේ ඝාතන පිළිබඳ පරීක්ෂණ ඇතුළත් විය යුතුය.

මෑත වසරවලදී සිදු වූ සිදුවීම් ගණනාවක් සම්පූර්ණයෙන් පරීක්ෂාවට ලක් කළ යුතුව ඇති නමුත් මේ සියලු මාධ්‍ය ක්‍රියාකාරිකයන් ඝාතනය කෙරී ඇත්තේ 2006 වසර තුළය.

---

මාධ්‍යවලට එරෙහිව සිදු කළ ප්‍රහාරයන්, ගැටුම්කාරී සියලුම පාර්ශ්වයන් විසින් සිදු කරන ලද බව හඳුනා ගනිමින් ජාත්‍යන්තර දූත මණ්ඩලය දැඩි ලෙස විශ්වාස කරන්නේ මුක්තිය සඳහා වූ චෝදනා එවැනි සිදුවීම් වැළැක්වීමේ හැකියාව ඇත්තන් වෙත පැවරෙන බවයි. එයට ආණ්ඩුව, ආරක්ෂක හමුදා සහ එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවලදී එල්.ටී.ටී.ඊ යද ඇතුළත් වේ. 2006 මැයි 02 වැනිදා කොළඹදී නිකුත් කරන ලද යුනෙස්කෝ ලෝක ජනමාධ්‍ය නිදහස් දින ප්‍රකාශනයෙහි සඳහන් වන පරිදි මාධ්‍ය ක්‍රියාකාරිකයන්ට සහ කාර්යාවලට ප්‍රහාර එල්ල කළවුන් අත් අඩංගුවට ගෙන නීතිය ඉදිරියට පැමිණ වීම සහතික කිරීම සඳහා බොහෝ දේ ඉටු කළ යුතුව තිබේ. මෙම සංදර්භය තුළ සියලුම සිද්ධීන් පිළිබඳව

12. නිශ්චිතවම මේ මඟින් අදහස් කෙරෙන්නේ යුධ සිරකරුවන්ට සැලකීම සම්බන්ධව 1949 අගෝස්තු 12 දරණ 3වැනි ජිනීවා ප්‍රඥප්තිය සහ යුධ ගැටුම් පවතින කලාපවල අනතුරුදායක තත්ත්වයන්හි සේවය කරන ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳව වූ අතිරේක විධි විධාන 1 හි 79 වැනි වගන්තිය ඇතුළත් 1977 ජූනි 8 දිනැති අතිරේක විධි විධානයන්ය. (එ.ජා. ආරක්ෂක මණ්ඩල යෝජනාව 1738)

සම්පූර්ණයෙන් පරීක්ෂණ පවත්වා ප්‍රගති වාර්තාවන් ක්‍රමානුකූල පදනමකින් ප්‍රකාශයට පත් කරන බවට පොරොන්දු වෙමින් ආණ්ඩුවේ ආරක්ෂක කටයුතු පිළිබඳ ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල මහතා විසින් කරන ලද ප්‍රකාශය ජාත්‍යන්තර දූත මණ්ඩලය පිළිගනියි.

තර්ජන සහ ප්‍රහාරයන් ගෙන් තම ක්‍රියාකාරිත්වයනට බලපෑමක් ඇති නොවන ලෙස සියලුම මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ සහ කාර්යාලවල ආරක්ෂාව ඔවුන් ඉල්ලා සිටින පරිදි තහවුරු කිරීමට කාලීනව සහ සම්පූර්ණ ලෙස උපකාර කිරීමට පොරොන්දු වීම. මාධ්‍ය සංස්කාරකවරුන් සහ හිමිකරුවන්ද තම ආයතනවල මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීමට තමනට හැකි උපරිමයෙන් පියවර ගත යුතුය.

සංස්කාරක ස්වාධිනත්වයට මැදිහත් වී බලපෑම් කිරීම නැවැත්වීම. රට පුරාම සිටින හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් මාධ්‍ය වල අන්තර්ගතය කෙරෙහි බලපෑම් කිරීමට මැදිහත් නොවිය යුතු බවට ආණ්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල මහතා විසින් ප්‍රකාශිත කැපවීම ජාත්‍යන්තර දූත මණ්ඩලය පිළිගනියි.

විශේෂයෙන් සිවිල් ජනතාව ගැටුමේ බලපෑමට ලක්ව ඇති ප්‍රදේශ ද ඇතුළත්ව රටේ ඕනෑම ප්‍රදේශයකට බාධාවකින් තොරව පූර්ණ වශයෙන් ඇතුළුවීමට ඉඩ ලබාදීම.

මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ ජීවිත සහ ඔවුනගේ පවුල් වල සාමාජිකයන්ගේ ජීවිත අනතුරට පත් වන ආකාරයට භයානක සහ වගකීමෙන් තොර ලෙස ප්‍රසිද්ධියේ අපවාද නැගීමක් මාධ්‍ය ක්‍රියාකාරිකයන් හා මාධ්‍ය ආයතන පැහැදිලිව සහ නිසැකව ඉලක්ක කෙරන ආකාරයෙන් හෙළා දැකීමේ විරෝධතාවන් නැවැත්වීම.

මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස සීමා කෙරෙන පරිදි දැනටමත් ගෙන ඇති ක්‍රියා මාර්ග සහ කිසියම් ආකාරයක ඍජු හෝ වක්‍ර වාරණයක් හඳුන්වාදීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග වෙනස් කිරීම.

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන නීතිය, රෙගුලාසි සහ බලතල විශේෂයන් 2005 අගෝස්තු සහ 2006 දෙසැම්බරයේ පැනවූ හදිසි නීති රෙගුලාසි, නිල රහස් පනත, පුවත්පත් මණ්ඩල නීති, විකාශන නීති, අධිකරණයට අපහාස කිරීම පිළිබඳ බලතල සහ එයට සම්බන්ධ සෙසු නීති යනාදිය පිළිබඳව සලකා බලමින් ඒවා මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳව ජාත්‍යන්තර ප්‍රමිතීන්හි මට්ටමට ගෙන ඒම සඳහා සුදුසු පරිදි සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීමට කටයුතු කිරීම. ව්‍යවස්ථාපිත පුවත්පත් මණ්ඩලයක් ඇති කිරීම පිළිබඳ උත්සාහක් වර්ධනය වෙමින් පවතින තත්වයකදී ජාත්‍යන්තර දූත මණ්ඩලය විශ්වාස කරන්නේ ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය සඳහා සුදුසු වන එකම රෙගුලාසිය වන්නේ ස්වාධීන ස්වයං නියාමනය බවයි.

තොරතුරු නිදහස සෑම දෙනාගේම මූලික අයිතිවාසිකමක් ලෙස හඳුනා ගනිමින් සහ එය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල තොරතුරු නිදහසේ නීතියක් ලෙස වහාම ක්‍රියාත්මක කිරීම.

රාජ්‍ය පාලිත මාධ්‍ය සංස්කරණ ස්වාධීනත්වය ආරක්ෂා කෙරෙන මහජන සේවා ජනමාධ්‍ය බවට විපරිවර්තනය කිරීම හෝ අයිතිය පුළුල් කිරීම හෝ පුද්ගලීකරණය කිරීම සඳහා ඉක්මනින් සියලු පියවර ගැනීම. ප්‍රජා ගුවන් විදුලි ඇතුළුව පුද්ගලික විකාශනයන්හි ස්වාධීනත්වය නීතිය මගින් සහතික කරමින් එය ස්වාධීන ආයතනයක් මඟින් නියාමනය කිරීම.

# 6 ඇමුණුම්

## 6.1 ඇමුණුම 1:

**"ශ්‍රී ලංකාවේ මාධ්‍ය සේවකයන්ට එරෙහි ප්‍රහාර සඳහා වූ මුක්තිය අහෝසි කරන" ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආරක්ෂක කටයුතු පිළිබඳ මාධ්‍ය ප්‍රකාශක ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා වෙත ජන මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ සභාපති ක්‍රිස්ටෝපර් වොරන් මහතා විසින් යවන ලද දකුණු ආසියානු කර්තෘවරුන්ගේ දූත මණ්ඩලයේ විවෘත ලිපිය.**

මාධ්‍ය නිවේදනය 2006 ඔක්තෝබර් 25 ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ මාධ්‍ය සේවකයන්ට එරෙහිව ප්‍රහාර සඳහා වූ මුක්තිය අහෝසි කරනු; දකුණු ආසියානු කර්තෘවරුන්ගේ දූත මණ්ඩලය

මසාර් අබ්බාස් ඒකක ප්‍රධානී AFP, කරච්චි, සහ ප්‍රධාන ලේකම් පකිස්තාන ජන මාධ්‍යවේදීන්ගේ ෆෙඩරල් සංගමය (PFUJ), ජැකොලයින් පාර්ක්, ආසියා - පැසිෆික් අධ්‍යක්ෂ, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය, ලක්ෂ්මී මූර්ති - වැඩ සටහන් කළමනාකාරිනී, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය, සුනන්ද දේශප්‍රිය - කැඳවුම්කරු, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය යන අයගෙන් සැදුම්ලත් නියෝජිත කණ්ඩායම 2006 ඔක්තෝබර් 24 දින ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආරක්ෂක කටයුතු පිළිබඳ මාධ්‍ය ප්‍රකාශක ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා හමු විය.

දිවයිනේ ආරක්ෂක තත්ත්වය අයහපත් බවට පත් වීමෙන් අනතුරුව මාධ්‍යවේදීන් මුහුණ දී සිටින අස්ථාවර තත්ත්වය සම්බන්ධව කරුණු විමසීමට දිවයිනට පැමිණි දූත කණ්ඩායමේ කොටසකගෙන් පෙර කී නියෝජිත කණ්ඩායම සමන්විත වේ.

එම නියෝජිත කණ්ඩායම විසින් පසුගිය වසර දෙක තුළ ඝාතනයට ලක් වූ මාධ්‍ය ක්‍රියාකාරිකයන් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඇතුළත් ජන මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ සභාපති ක්‍රිස්ටෝපර් වොරන්ගේ ලිපියක් රඹුක්වැල්ල මහතා වෙත භාරදෙනු ලැබූ අතර, එම ලිපියෙහි සඳහන් සියලුම සිද්ධීන් සම්බන්ධයෙන් සොයා බලනු ලබන බව රඹුක්වැල්ල මහතා නියෝජිත කණ්ඩායම වෙත සහතික විය.

2006 ඔක්තෝබර් 10 වැනිදා රඹුක්වැල්ල මහතා ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය ඇතුළුව මාධ්‍ය නිදහස සහ ප්‍රකාශන නිදහස පිළිබඳ ජාත්‍යන්තර දූත මණ්ඩලය මුණ ගැසිණි. එම දූත මණ්ඩලය දිවයිනට පැමිණියේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසෙහි වාතාවරණය පිළිබඳව ඇගයීමක් කිරීමටය.

භාර දෙනු ලැබූ ලිපිය මෙසේය.

වෙත
ගරු කෙහෙළිය රඹුල්වැල්ල,
අමාත්‍ය සහ ආරක්ෂක මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා රජය

ප්‍රිය මහත්මයාණෙනි,

පසුගිය මාස කිහිපය තුළ ඉහළ ගිය ප්‍රචණ්ඩ ප්‍රහාර නිසා පුද්ගලයන් අහිමි වීම කරණ කොටගෙන දුකට පත් වූ පවුල්වල සාමාජිකයන් වෙත ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය (IFS) වෙනුවෙන් අපගේ කණගාටුව ප්‍රකාශ කිරීමට මුලින්ම ඉඩ දෙන්න.

ඔක්තෝබර් 10 වැනිදා ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය පිළිබඳව ඇගයීමක් කරනු පිණිස දිවයිනට පැමිණි ජන මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයද ඇතුළත් මාධ්‍ය නිදහස හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳව වූ ජාත්‍යන්තර දූත කණ්ඩායම ඔබතුමා හමු වූ බව මතක ඇතැයි මම සිතමි. එම සාකච්ඡාවෙහිදී මාධ්‍ය ක්‍රියාකාරිකයන් ගණනාවකගේ ඝාතනයන් පිළිබඳව පරීක්ෂණ පවත්වන බවට ඔබතුමා සහතික විය.

එම සියලුම සිද්ධීන් පිළිබඳව පූර්ණ වශයෙන් පරීක්ෂණ පවත්වන බවත් එම පරීක්ෂණවල ප්‍රගතිය පිළිබඳව වාර්තා විධිමත් පදනමකින් ප්‍රකාශයට පත් කරන බවටත් ඔබතුමා එම දූත මණ්ඩලය වෙත දුන් පොරොන්දුව ජන මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයත් එම දූත මණ්ඩලය සහ එහි අනුග්‍රාහකයනුත් පිළිගනියි.

ඝාතන සහ සිදුවීම් ගණන පිළිබඳව ඔබේ තොරතුරු සහ මෙම ඝාතන පිළිබඳව සිවිල් සමාජය විසින් ඉදිරිපත් කරන ලේඛන අතර ගැලපීමක් දකින්නට නොලැබෙන හෙයින් අදාළ තොරතුරු ඔබ වෙත ඉදිරිපත් කිරීමට අපි මෙය අවස්ථාවක් කර ගනිමු.

අපගේ ඉල්ලීමට හේතු සාධක වූ මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් පිළිබඳ තොරතුරු මෙසේය.

2005

- ධර්මරත්නම් සිවරාම් - 2005 අප්‍රේල් 29. ධර්මරත්නම් සිවරාම්ගේ සිරුර සොයා ගැණුනේ කොළඹ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු සංකීර්ණය ආසන්නයේ අධි ආරක්ෂක කලාපයේ දී ය. සිරුර සොයා ගනු ලැබූ දිනට පෙර දින රාත්‍රියේ 10.30 ට පමණ නාඳුනන කල්ලියක් විසින් අවන්හලකින් පිටත දී සිවරාම් පැහැරගනු ලැබිණි. ඔහුගේ සිරුර හමු වූ අධි ආරක්ෂක කලාපය නිරන්තරයෙන් ශ්‍රී ලංකා ආරක්ෂක අංශවල මුර සංචාර සිදු කෙරෙන ප්‍රදේශයකි. ප්‍රධාන පෙළේ ස්වදේශීය කණ්ඩායම් ඔහුගේ මරණය පිළිබඳව ආණ්ඩුව වෙත චෝදනාව එල්ල කරනු ලැබීය. "තාරකී" නමින් ප්‍රකටව සිටි ධර්මරත්නම් සිවරාම් ඩේලි මිරර් ඉංග්‍රීසි භාෂාමය පුවත්පතට දේශපාලන කොළම් රචනා කළ අයෙකු වූ අතර tamilnet.com නමැති අන්තර්ජාල අඩවියේ සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයකු ද විය. ඒ හැරුණු කොට ඔහු ශ්‍රී ලංකා රජය ප්‍රසිද්ධියේ විවේචනය කරන්නෙකු ද විය.
- රේලංගී සෙල්වරාජා - 2005 අගෝස්තු 12. රේලංගි සෙල්වරාජා සහ ඇගේ සැමියා නාඳුනන තුවක්කුකරුවකු විසින් වෙඩි තබා ඝාතනය කරන ලද්දේ දහවල් 1.00 ට පමණ කොළඹ බම්බලපිටියේ දීය. සෙල්වරාජා මුලින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නිවේදිකාවක ලෙස කටයුතු කර තිබූ අතර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාධ්‍යවේදිනියක ලෙස සේවය කරමින් සිටියාය.

2006

- සුබ්‍රමානියම් සුගයිධරාජන් - 2006 ජනවාරි 24. ත්‍රිකුණාමල වරායේ සේවකයකු මෙන්ම මාධ්‍යවේදියකු ද වූ සුගයිධරාජන් වෙඩි තබා ඝාතනය කරන ලද්දේ ඔහු උදෑසන සේවයට යෑමට බස් නැවතුමේ සිටියදීය. ඔහු ත්‍රිකුණාමලයේ ක්‍රියාත්මක ව සිටි හමුදා සහ අතුරු හමුදා කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පිළිබඳ විවේචනාත්මක ඡායාරූප සහ ප්‍රවෘත්ති වාර්තා කිහිපයක් "සුඩරෝලි" පුවත්පත මගින් ප්‍රකාශයට පත්කර තිබිණි. සුගයිධරාජන් විසින් ඡායාරූප ගත කරන ලද, ජනවාරි 2 වෙනිදා ත්‍රිකුණාමලයේදී මියගිය ශිෂ්‍යයන් 5 දෙනෙකුගේ ඡායාරූප ප්‍රකාශයට පත් වීම හේතුවෙන් එම මියයාම් සිදු වුයේ ග්‍රෙනේඩ් බෝම්බයක් පුපුරා යාමෙන් බවට එතෙක් ප්‍රකාශිතව තිබූ මුල් වාර්තාවන් අභියෝගයට ලක් විය.
- සුරේෂ් කුමාර් සහ රන්ජිත් කුමාර් - 2006 මැයි .3 මාධ්‍ය ක්‍රියාකාරිකයන් ලෝක මාධ්‍ය නිදහස් දිනය සැමරීමට කොළඹට රැස්ව සිටිය දී උතුරේ ප්‍රධාන නගරය වූ යාපනයේ පිහිටි "උදයන්" ප්‍රවෘත්තිපත්‍ර කාර්යාලයට හඳුනා නොගත් පිරිසක් ප්‍රහාරයක් එල්ල කළහ. එම ප්‍රහාරයෙන් උදයන් පුවත්පතේ අලෙවි කළමනාකරු වූ සුරේෂ් කුමාර් සහ බෙදාහැරීමේ අංශයේ සේවයේ නියුතුව සිටි රංජිත් කුමාර් යන දෙදෙනා මරණයට පත්වූහ. තවත් පස් දෙනෙකුට තුවාල සිදු වූ අතර කාර්යාලයට ද හානි සිදුවිය. පොලිසිය පුද්ගලයන් 6 දෙනෙකු අත් අඩංගුවට ගත් නමුත් ඔවුන් ඇප පිට නිදහස් කරන ලදහ. යාපනයේ සමහර මූලාශ්‍රවලට අනුව අත්අඩංගුවට පත් පුද්ගලයන් කිසි ලෙසකින් එම සිද්ධියට සම්බන්ධ වූවන් නොවේ.

- ලක්මාල් ද සිල්වා - 2006 ජුලි 2. නිදහස් මාධ්‍යවේදියකු වූ ලක්මාල් ද සිල්වා නාඳුනන කණ්ඩායමක් විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබුවේ 2006 ජුලි 2 වැනිදාය. ඔහු කොළඹ දකුණු ප්‍රදේශයේ බොරලැස්ගමුවේ පිහිටි ඔහුගේ දෙමාපියන්ගේ නිවසින් පැහැරගෙන යනු ලැබුවේ උදෑසන 5.00ට පමණය. වෙඩිතබා ඝාතනය කෙරුණු ඔහුගේ සිරුර නිවසේ සිට කිලෝමීටර් තුනක් පමණ ඈත ස්ථානයක දී හමුවිය. ලක්මාල්ගේ මව ප්‍රකාශ කළේ ඔහු කලක සිට හඳුනන හමුදා නිලධාරීන් පිරිසක් හමුවීමට ගිය බවය.
- මරියදාස් මනෝජන්රාජ් - 2006 අගෝස්තු 1 . පුවත්පත් අලෙවි කරන්නකු වූ මරියදාස් මනෝජන්රාජ් අටවා තිබූ බෝම්බයක් පුපුරා යාමෙන් මියගියේ ජුලි 27 වෙනිදා බෙදා හැරීම සඳහා පුවත්පත් ගෙන ඒමට යාපනයට යමින් සිටියදීය. මෙම ප්‍රහාරය එල්ල වුයේ දෙමළ භාෂා පුවත්පත් යාපනයට බෙදාහැරීමට එරෙහිව මරණීය තර්ජන එල්ල වී තිබියදීය.
- සතාසිවම් බාස්කරන් - 2006 අගෝස්තු 16. ඔහු යාපනයේ මුද්‍රණය කෙරෙන "උදයන්" පුවත්පතේ බෙදාහැරීමේ අංශයේ රියැදුරෙකි. ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කරන ලද කාලය තුළ පුවත්පත බෙදා හැරීම සඳහා අවස්ථාව ලබා ගත් බාස්කරන් පුවත්පත් බෙදාහරින වාහනය තුළ දීම වෙඩි තබා ඝාතනය කර තිබිණි. ඔහු ඝාතනය කෙරුණේ ඉතා පැහැදිලිව උදයන් පුවත්පතට අයත් බව සටහන් කර තිබූ වාහනය රජයේ හමුදා පාලනය පවතින ප්‍රදේශයේ පදවාගෙන යද්දීය. ටැමිල්නෙට් වෙබ් අඩවියට අනුව වෙඩි තැබීම සිදු කර ඇත්තේ හමුදා සොල්දාදුවන් විසිනි.
- සින්නතම්බි සිවමහාරාජා - 2006 අගෝස්තු 21. යාපනයේ මුද්‍රණය කෙරෙන දෙමළ භාෂාමය "නමුදු ඊළනාඩු" පුවත්පතේ කළමනාකාර අධ්‍යක්ෂ වරයා වූ සින්නතම්බි සිවමහාරාජා වෙඩි තබා ඝාතනය කරනු ලැබ තිබුණේ වෙලිප්පලෙයි ප්‍රදේශයේ දීය. එම ඝාතනයත් සමඟම "නමුදු ඊළනාඩු" පුවත්පත ප්‍රකාශනය නැවතිණි.

මෙම සියලු සිදුවීම් ඔබට ආගන්තුක නොවෙතැයි මම විශ්වාස කරමි. මේ මාධ්‍යවේදීන් සහ සෙසු මාධ්‍ය සේවකයන් සියලු දෙනා ඝාතනයට ලක් වී ඇත්තේ ගත වූ මාස 16 තුළදීය.

මේ සියලුම පුද්ගලයන්ගේ ඝාතන පිළිබඳව වූ පරීක්ෂණවල ප්‍රගති වාර්තාවන් කැඳවන ලෙසත් එම වාර්ත ාවල පිටපත් අපගේ දේශීය සංවිධාන වෙත ද ලබා දෙමින් හැකි තාක් ඉක්මනින් ප්‍රසිද්ධියට පත් කරන ලෙසත් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමට අපි කැමැත්තෙමු. ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය වෙනුවෙන් එහි පිටපත නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත ලබා දීම සුදුසුය. ඔබේ අවධානය පිණිස එම දූත මණ්ඩලයට අනුග්‍රහ දක් වූ සංවිධානවල ලැයිස්තුවක් ද මම මේ සමඟ ඉදිරිපත් කරමි.

ඔබතුමා කාර්ය බහුල කාල සටහනක් ඇති අයෙකු බව මම දනිමි. ඒ නිසාම අපගේ නියෝජිත කණ්ඩායම හමු වීමට කාලය වෙන් කර දීම වෙනුවෙනුත් එම හමුවීමේදී දක් වූ කාරුණික භාවය වෙනුවෙන් සහ අප ඉදිරිපත් කළ කරුණු පිළිබඳව සොයා බැලීමට දක්වූ නොමසුරු එකඟතාව වෙනුවෙනුත් ඔක්තෝම්බර් 10 වැනිදා මේ හමුව වෙනුවෙන් ගත කළ අගනා කාලය වෙනුවෙන් ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය වෙනුවෙන් ඔබ තුමාට මම ස්තුතිය ප්‍රකාශ කරමි.

මෙම ලිපියට ඔබේ ප්‍රතිචාරයක් අපේක්ෂා කරමි.

මෙයට, විශ්වාසී,
ක්‍රිස්ටෝපර් වොරන්
සභාපති
ජන මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය.

## 6.2 ඇමුණුම 2:

### "හදිසි නීති (ත්‍රස්තවාදය වැළැක්වීම සහ තහනම් කිරීම) රෙගුලාසි 2006 හඳුන්වා දීම පිළිබඳ නිවේදනය" - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ "නව පියවරයන් පිළිබඳ නිවේදනය" - නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

**හදිසි නීති (ත්‍රස්තවාදය වැළැක්වීම හා තහනම් කිරීම) රෙගුලාසි 2006 හඳුන්වා දීම පිළිබඳ නිවේදනය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2006 දෙසැම්බර්**

2006 දෙසැම්බරයේදී හඳුන්වා දෙනු ලැබූ හදිසි නීති (ත්‍රස්තවාදය සහ විශේෂිත ත්‍රස්ත ක්‍රියාකාරකම් වැළැක්වීමේ) රෙගුලාසි හඳුන්වා දීමේ ක්‍රියාවලිය සහ ඒ තුළ අන්තර්ගත වන කරුණු සම්බන්ධව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම අවධානය යොමු කරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශ්වාස කරන්නේ, මෙම නව රෙගුලාසි හඳුන්වා දීම පිළිබඳව නිසි පරිදි ප්‍රතිචාර දැක්වීමේදී වත්මන් දේශපාලන සහ ව්‍යවස්ථාමය සංදර්භයෙන් හුදකලා කොට එවැන්නක් සිදු කළ නොහැකි බවයි. එහෙයින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආණ්ඩුවෙන් සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ වලින් ඉල්ලා සිටින්නේ මෙම රෙගුලාසි පුනරීක්ෂණය කරමින් ජාත්‍යන්තර මානව හිමිකම් වලට සහ නීතියේ ආධිපත්‍යයට ගැලපෙන පරිදි සංශෝධනය කරන ලෙසයි.

**අපගේ අවධානය යොමු වී ඇති ප්‍රධාන කරුණු කෙටියෙන් දක්වන්නේ නම්,**

- සිවිල් සමාජ කණ්ඩායම්වල නෛතික ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම්, විරුද්ධ අදහස් පළකිරීම් සහ ස්වාධීනත්වය කප්පාදු කරන්නා වූ සමහර රෙගුලාසිවල ඇතුළත් අතිශයින් ප්‍රබල භාෂාව,
- අනෙකුත් දේ අතර මානව හිමිකම් සහ ජාතික අනුකලනය ආදිය වෙනුවෙන් කැප වූ සිවිල් සමාජ සංවිධාන සහ මාධ්‍ය වල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිසි බලධරයා වෙත පවරනු ලැබ ඇති අතිමහත් අභිමතානුසාරී බලය,
- බලය බෙදී යාමේ මූලධර්මය විවෘත ලෙස උල්ලංඝනය කරන්නා වූත්, ආණ්ඩුවේ අධිකරණ ක්ෂේත්‍රය ව්‍යවස්ථා විරෝධී ලෙස ආක්‍රමණය කරන්නා වූත් අභියාචනා විනිශ්චය සභාවේ සංයුතිය සහ නෛතික ස්ථාවරය,
- මුක්තිය පිළිබඳව වූ සංස්කෘතියෙහි පැරණි වාර්තා සහ වත්මන් සංදර්භය තුළ රෙගුලාසි අංක 15 හි සඳහන් වගන්තියෙහි වූ පුළුල් නිදහස්කම යෝජිත රෙගුලාසිවලට අනුකූලව යහපත් චේතනාවෙන් රාජකාරීමය පියවර ගනු ලැබූ බව කියමින් පොලිස් නිලධාරීන්, සන්නද්ධ හමුදා සහ සෙසු පුද්ගලයන් ආරක්ෂා කිරීමට යොදා ගනු ලැබිය හැකිය.

2002 පෙබරවාරියෙහිදී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එල්. ටී. ටී. ඊ. ය එළැඹගත් එදිරිවාදිකම් නැවැත්වීමේ ගිවිසුමෙහි වගන්ති යටතේ අත්හිටුවන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි කොටස් නැවත ක්‍රියාත්මක කිරීමට ගන්නා කවර හෝ උත්සාහයකට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විරෝධතාවය දක්වයි.

අපගේ අවධානයන් මෙහි පහත සවිස්තරව සඳහන් කරමු.

දෙසැම්බර් 7 වැනිදා බදාදා කැබිනට් මණ්ඩලය විසින් සැබැවින්ම ගන්නා ලද තීරණය කුමක්දැයි පුළුල් වික්ෂිප්තභාවයක් තිබේ. ජනාධිපතිවරයා සහ අගමැතිවරයා ප්‍රසිද්ධ නිවේදන නිකුත් කරමින් 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත නැවත හඳුන්වා දෙන ලද බව ප්‍රකාශ කළද ආණ්ඩුව ජනතාවට නිකුත් කළේ මහජන ආරක්ෂක නියෝගය යටතේ ප්‍රසිද්ධියට පත් කරන ලද හදිසි නීති (ත්‍රස්තවාදය සහ විශේෂිත ත්‍රස්ත ක්‍රියා වැළැක්වීමේ) රෙගුලාසි නමින් යුත් නව හදිසි නීති රෙගුලාසි මාලාවකි. අමාත්‍යවරුන් සමහර දෙනෙකු තම ප්‍රසිද්ධ ප්‍රකාශ මඟින්

වැඩිදුරටත් නිවේදනය කරනු ලැබුවේ මෙම නව රෙගුලාසි හඳුන්වා දීම ආණ්ඩුවේ ඒකමතික තීරණයක් බවයි. මාධ්‍ය වාර්තා මගින් ප්‍රකාශ වූයේ මේ බව එල්. ටී. ටී. ඊ. ය සංවිධානය වෙතද සන්නිවේදනය කර ඇති බවය.

පෙර කී ව්‍යාකූල භාවය පිළිබඳවත් මානව හිමිකම්, රාජ්‍යයේ බලය සහ එහි පුරවැසියන්ගේ බලය ගැනත් යහපාලනය පිළිබඳවත් බලවත් ප්‍රතික්‍රියාවන් ඇතිකරන්නා වූ ප්‍රස්තුත මාතෘකාව සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් විවිධ අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳවත් අපගේ දැඩි අවධානය පළකරන අතරම ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ මේ කරුණු සම්බන්ධව වහාම පැහැදිලි කිරීමක් කරන ලෙසයි. අපගේ නිරීක්ෂණයන් මෙහි පහත දක්වමු.

**හදිසි නීති රෙගුලාසි (ත්‍රස්තවාදය සහ සුවිශේෂී ත්‍රස්ත ක්‍රියා වැළැක්වීමේ 2006)**

සඳහන් කරනු ලැබ ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හැරුණු කොට සමහර රෙගුලාසිවල වූ පුළුල් භාෂාව මගින් ජාතික ආරක්ෂාව සහ ත්‍රස්තවාදය මර්දනය කිරීමේ නාමයෙන් සිවිල් සමාජ කණ්ඩායම්වල නෛතික ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරිත්වය, විරුද්ධ මත ප්‍රකාශ කිරීම සහ ස්වාධීනත්වය කප්පාදු කිරීමට, පාලනය කිරීමට හෝ තහනම් කිරීමට රාජ්‍යයට නීත්‍යානුකූල හැකියාවක් ලැබීම ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධානය යොමු කරයි.

රෙගුලාසි අංක 2, 3 සහ 4 මගින් තහනම් කරනු ලැබ ඇති ක්‍රියාකාරකම්වල පුළුල් භාවයත් රෙගුලාසි අංක 16 (1) හි සඳහන් ත්‍රස්තවාදය පිළිබඳ අර්ථ දැක්වීමත් රෙගුලාසි අංක 15 හි ඇතුළත් නිදහස් කරනු ලැබීමේ වගන්තියත් පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමු වෙයි. මෙම විධිවිධානයන් බෙහෙවින් පුළුල්ය. වඩාත් පුළුල් භාෂාවකින් කෙටුම්පත් කරනු ලැබ ඇත්තේ සිවිල් සමාජයේ නෛතික ක්‍රියාකාරකම් මාලාවක්ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කරනු ලැබ ඇති මූලික අයිතිවාසිකම් ද අපරාධ ලෙස හැඳින්වීමට ඉඩකඩ සැලසෙන ආකාරයෙනි.

කෙසේ නමුත් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන නිසි බලධරයාගේ ලිඛිත අවසරය ලබා ගැනීමෙන් සාමය ගොඩ නැගීම සහ ත්‍රස්තවාදය අවසන් කිරීම වැනි සමහර අවස්ථා වලදී අනුමත ගනුදෙනුවලට සම්බන්ධ වන්නට හැකිවන නිදහස් කිරීමක් රෙගුලාසි මගින් සපයා දී තිබේ. මේ මගින් මානව හිමිකම් සහ ජාතික ඒකාබද්ධතාවය වෙනුවෙන් කැප වූ සිවිල් සමාජ සංවිධාන කෙරෙහි මෙන්ම මාධ්‍ය කෙරෙහිද ඒවායේ කටයුතු කෙරෙහිද බලපවත්වන්නා වූ අසීමිත අභිමතානුසාරී බලයක් නිසි බලධරයා වෙත පවරා දෙනු ලබයි. එවැනි බලයක් සිවිල් සමාජ සංවිධානවල ස්වාධීනත්වය සහ ප්‍රකාශණයේ නිදහසත් එක් රැස්වීමේ නිදහසත් ඇතුළු සෙසු නිදහසත් කෙරෙහි ආණ්ඩුවේ අනවශ්‍ය පාලනයක් ඇති කරන්නකි.

මෙම රෙගුලාසිවල වඩාත් නරක භයානකකම වන්නේ පෙර කී ආකාරයෙන් ජනාධිපති විසින් පත්කරනු ලැබුවකුගේ තීරණයන් පිළිබඳව වූ අභියාචනා විනිශ්චය කිරීමේ මණ්ඩලය ද සම්පූර්ණයෙන් ම ජනාධිපති විසින් පත් කරනු ලබන්නන්ගෙන් සමන්විත වීමය. එසේ වූ කල එම මණ්ඩලය තම තනතුරු දරන්නේ හුදෙක් ජනාධිපතිවරයාගේත් ආරක්ෂක, මුදල්, ජාතිය ගොඩනැංවීමේ සහ අධිකරණ අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේත් කැමැත්ත මත වෙයි. මේ ආකාරයෙන් ආණ්ඩුවේ විධායකයේ ශාඛාවක් වූ පුද්ගලයන් පිරිසක් වෙත තරමක අධිකරණමය බලයක් පවරනු ලැබීම බලය බෙදාදීම පිළිබඳව වූ මූලධර්මය එළිපිටම උල්ලංඝනය කරන්නක් පමණක් නොව ආණ්ඩුවේ අධිකරණමය ක්ෂේත්‍රය ව්‍යවස්ථා විරෝධී ලෙස ආක්‍රමණය කරන්නක්ද වෙයි.

අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සමන්විත විනිශ්චය සභාව ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන්නේ යැයි විශ්වාස කිරීම උගහටය.

රෙගුලාසිවල සඳහන් කරනු ලැබ ඇති අන්දමට තම රාජකාරි ඉටු කිරීමේදී යහපත් අරමුණින් ගන්නා ලද ක්‍රියාමාර්ග ලෙස හැඳින්විය හැකි පියවරයන් ගැනීම වෙනුවෙන් පොලිස්, ආරක්ෂක හමුදා සහ වෙනත් පුද්ගලයන් වරදකාරිත්වයෙන් මුදවා හැරීමට දී ඇති පුළුල් නිදහස් කිරීමේ වගන්ති (රෙගුලාසි 15) පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම විශේෂ අවධානය යොමු කරයි. ස්වාධීන සොයා බැලීමක් නැති, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි අනතුරුදායක නීති නෛතික ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම් සහ දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කිරීම සඳහා යොදවා ගැනුණු ඉතිහාසයක් ඇති සහ ශ්‍රී ලංකාවේ මෑත මාස කිහිපය තුළ මුක්තියේ සංස්කෘතියක් වර්ධනය වූ තත්ත්වයක් තුළ මෙම රෙගුලාසි මඟින් රජයට සහ එහි නිලධාරීන් වෙත පුළුල් බලතල ලබා දී ඇති වගන්ති, අවංක භාවයෙන් යුක්තව ක්‍රියාකරනු ලැබුවත් වරදකාරිත්වයෙන් නිදහස් කරනු ලැබීමට වඩා පහසුවෙන් මුක්තිය ප්‍රවර්ධනය කරන උපකාරක බවට පත් වීමේ අවදානමක් තිබේ.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත**

2002 පෙබරවාරියෙහිදී ශ්‍රී ලංකා ආණ්ඩුවත් එල්.ටී.ටී.ඊ. සංවිධානයත් අතර අත්සන් කෙරුණු එදිරිවාදිකම් නැවැත්වීමේ ගිවිසුමට අනුකූලව අත් හිටුවනු ලැබූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි කොටස් නැවත ක්‍රියාවට නැංවීම සඳහා වූ ඕනෑම උත්සාහයකට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විරෝධතාවය දක්වයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 1979 දී විරුද්ධ දේශපාලන පක්ෂවල සහ සිවිල් අයිතිවාසිකම් කණ්ඩායම්වල පුළුල් විරෝධතාවය මධ්‍යයේ එවකට පැවති ජේ.ආර් ජයවර්ධන ආණ්ඩුව විසින් හඳුන්වා දෙනු ලැබූ, මූලික ජාත්‍යන්තර මානව හිමිකකම් පිළිගැනීම්වලට එකඟ නොවන භයානක නීතියකි. එයට ත්‍රස්තවාදය මර්දනය කරන්නට හෝ දමනය කරන්නට හැකියාවක් නොලැබුනු අතර එය භාවිතා කෙරුණේ දේශපාලන විරුද්ධවාදීන් බිය ගැන්වීමට හා ඔවුනට හිරිහැර කිරීමටය. එසේම එය මඟින් මුක්තියේ සංස්කෘතිය පෝෂණය කරනු ලැබීය.

**නිගමනය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විශ්වාසය වත්මන් දේශපාලන සහ ව්‍යවස්ථාමය සංදර්භයෙන් හුදකලා කොට මෙම නව රෙගුලාසි හඳුන්වාදීම පිළිබඳව සුදුසු ප්‍රතිචාර දැක්වීම කළ නොහැකි බවයි. ආණ්ඩුව විසින් නොකඩවා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය බරපතල ලෙස උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්දේශපාලනිකරණය, ස්වාධිනත්වය, සුපිළිපන්න භාවය සහ යහපාලනය ලබා දෙන කිසිදු ස්වාධීන කොමිසමක් නොමැති, තත්ත්වයක් ද නීතියේ ආධිපත්‍යය පිළිබඳව, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව සහ පාර්ලිමේන්තු විපක්ෂයේ ඵලදායීතාවය පිළිබඳව බලවත් කණස්සල්ලක් ඇති වී තිබෙන සහ ජාතික හදිසි අවස්ථාවකදී ආණ්ඩු විසින් අසාමාන්‍ය බලතල තමන් වෙත පවරා ගනු ලබන අවස්ථාවක එහි පාලක බලවේගය ලෙස ක්‍රියා කරන්නා වූ ව්‍යවස්ථාමය සහ නෛතික ආරක්ෂාවන් නොමැති සන්දර්භයක් වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතී. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආණ්ඩුවෙන් සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ වලින් ඉල්ලා සිටින්නේ යට දැක්වූ ඌණතාවයන් විසඳීම සඳහාත් රෙගුලාසි ජාත්‍යන්තර මානව හිමිකම් පිළිගැනීම් සහ නීතියේ ආධිපත්‍යය සමඟ එකඟ වන ලෙසටත් පුනරීක්ෂණ කර සංශෝධනය කරන ලෙසටය.

24/2, 28 වන පටුමඟ, මල්පාර, කොළඹ 07
දුරː 094 11 2565404-6, 094 11 5552746, 094 11 5552748
ෆැක්ස්ː 094 11 4714460
විද්‍යුත් තැපැලː cpa@sri.lanka.net
වෙබ් අඩවියː www.cpalanka.org

**නව හදිසි නීති පියවරයන් පිළිබඳ නිවේදනය**

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය 2006 දෙසැම්බර් 08**

මේ සතියේ ආණ්ඩුව විසින් හඳුන්වා දෙනු ලැබූ මහජන ආරක්ෂාව සහ ත්‍රස්ත විරෝධී පියවරයන් බොහෝ දුරට ශ්‍රී ලංකාවේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට බෙහෙවින් හානිකර විය හැකිය.

2006 දෙසැම්බර් 6 දින සිට පනවන ලද නවාංග ගණනාවක් ද ඇතුළත් නව හදිසි නීති රෙගුලාසි (හදිසි නීති (ත්‍රස්තවාදය සහ විශේෂිත ත්‍රස්ත ක්‍රියා වැලැක්වීමේ) රෙගුලාසි) පිළිබඳව ජාතික ආරක්ෂාව සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පදනමින්, ප්‍රකාශනයේ නිදහස සහ එහි සීමාවන්හි තිබිය යුතු සමබරතාවය සඳහා පනවා ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන් තෘප්ත කිරීම ගැන වැඩි දුර පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) මෙම රෙගුලාසි පැනවීම පිළිබඳ තම දැඩි කණස්සල්ල පළ කරයි. ඒ මඟින් වාරණය, මානව හිමිකම් උල්ලංඝනය, සිවිල් සමාජයට ගැටුම් විපරිවර්තන කාර්යයන්හිලා ක්‍රියා කිරීමට ඇති හැකියාව හා අවකාශය සීමා කිරීම මෙන්ම මාධ්‍ය නිදහස සෝදා පාළුවට ලක්වීමද සිදුවිය හැකි බව අපට බලවත් ලෙස දැනෙයි. (මෙම නව රෙගුලාසි කියැවීම සඳහා කරුණාකර පහත සඳහන් වෙබ් අඩවියට පිවිසෙන්න.)

http://www.freemediasrilanka.org/index.php?action=con_news_full&id=389 sion=news)

ත්‍රස්තවාදය වැළැක්වීම ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක නෛතික අපේක්ෂාවකි. එසේම ත්‍රස්තවාදයත් විශේෂිත ත්‍රස්ත ක්‍රියාත් නෛතික ලෙස අර්ථ නිරූපණය කිරීමද ඒ සඳහා ලැබිය යුතු දඬුවම් ප්‍රතිපත්තිමය වශයෙන් සාධාරණීකරණය කිරීමද අවශ්‍යතාවයකි.

කෙසේ නමුත් එවැනි පියවරයන් ගැනීමේ දී ඒවා පනවනු ලබන අවශ්‍යතාවය සඳහා අපැහැදිලි හෝ බෙහෙවින් පුළුල් නොවීමටත් ව්‍යවස්ථාමය වශයෙන් ආරක්ෂා කර ඇති අයිතිවාසිකම් කෙරෙහි බලපාන්නා වූ සීමාවන් පැනවීමේ දී එම සීමාවන් හැම විටම, වැළැක්වීමට අපේක්ෂිත හානියට සමානුපාතික වීමට සහතික වීම කෙරෙහිත් බලවත් සැලකිල්ලක් දැක්විය යුතුය.

එමනිසා දැනටමත් ක්‍රියාත්මක වන රෙගුලාසිවලට අමතරව හඳුන්වා දෙන නව රෙගුලාසි මඟින් බෙහෙවින් පුළුල් තේරුමකින් ත්‍රස්තවාදය අර්ථ නිරූපනය කරන්නටත් ඊට එරෙහිව ක්‍රියාත්මක වන්නටත් උත්සාහ කරන බව සහ ඒ මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට සහ මූලික අයිතිවාසිකම් වලට තර්ජනයක් එල්ල විය හැකි බවත් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ගැඹුරු අවබෝධයයි.

නිකුත් කරනු ලැබ ඇති නවතම නිවේදනය 2001 අංක 1373 දරණ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව විසින් පිළිගෙන ඇති නෛතික ත්‍රස්ත විරෝධී පියවරයන් හි ස්වභාවයන් බලතල සමඟ නොගැලපෙන බව අපට පෙනී යයි. ඒ හැරුණු කොට හදිසි නීතිවලට අදාළව ශ්‍රී ලංකාවේ බලය අයුතු ලෙස භාවිතා කිරීමේ දිගු ඉතිහාසය සමඟ සැලකූ කල නව රෙගුලාසිවල ඇති සමහර කරුණු සම්බන්ධයෙන් බලවත් කණස්සල්ලක් ඇති වේ.

විශේෂයෙන් සඳහන් කළ යුත්තේ රෙගුලාසි අංක 2, 3, 4 සහ 4 මඟින් තහනම් කරනු ලැබ ඇති ක්‍රියාකාරකම් මාලාවෙහි පිළිගත නොහැකි පුළුල් බව සහ රෙගුලාසි අංක 16(1) හි ත්‍රස්තවාදය අර්ථ දක්වා ඇති ආකාරයයි. මෙම විධිවිධානයන් පුළුල් භාෂාවකින් කෙටුම්පත් කර ඇති ආකාරයෙන් මාධ්‍ය වල සහ සිවිල් සමාජවල භූමිකාව ද ඇතුළත් වන ප්‍රජාතන්ත්‍රවාදී නීත්‍යානුකූල ක්‍රියාකාරකම් මාලාවක් අපරාධ ලෙස නම් කිරීමේ ඉඩ කඩක් සපයා දී තිබේ. එසේම එය ප්‍රකාශනයේ නිදහස ඇතුළුව ව්‍යවස්ථාපිතව ආරක්ෂා කොට ඇති මූලික අයිතිවාසිකම් පැහැදිලි ලෙසම කඩ කරන්නකි.

නව රෙගුලාසි මගින් ත්‍රස්තවාදීන් ලෙස නම් කරනු ලැබ ඇති පුද්ගලයන්

හෝ සංවිධාන සමඟ කරනු ලබන "ගනුදෙනු" තහනම් කිරීම ත්‍රස්තවාදීන් ලෙස නම් කරනු ලැබ ඇති පුද්ගලයන් හෝ සංවිධාන සමඟ නිසි බලධරයාගේ (රෙගුලාසි අංක 11 යටතේ පත් කරනු ලබන) ලිඛිත අවසරයක් ඇතිව අනුමත ගනුදෙනුවල නියැලෙන්නට හැකිවන පරිද්දෙන් නීතියෙන් නිදහස් කරනු ලැබීමක් (රෙගුලාසි අංක 4ට වූ පළමු ව්‍යතිරේකය) ඇතුළත් කර තිබේ.

මෙය ඉහළම මට්ටමින් නීතිය අයුතු ලෙස යොදා ගැනීමට ඉඩකඩ සලසනු ලබන සහ මාධ්‍ය නිදහසත්, සිවිල් සමාජයත් කෙරෙහි ආණ්ඩුවේ පාලනය ඇති වීමටත් තුඩු දෙන පුළුල් බලයකි. ඒ සමානවම අභියාචනා විනිශ්චය සභාවේ (රෙගුලාසි අංක 13 සහ 14) භූමිකාව තුළ විධායකයේ ක්‍රියාකාරකම් ස්වාධීනව සොයා බැලීමක් අපේක්ෂා කළ නොහැක්කේ එම මණ්ඩලය අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සමන්විත වන හෙයිනි.

සමස්තයක් ලෙස ගත් කල විශේෂයෙන් වත්මන් අභියෝගාත්මක ආරක්ෂක වාතාවරණයේ මෙවැනි පුළුල් බලතල සමූහයක් භාවිතා කෙරෙන විට මූලික අයිතීන් උල්ලංඝනය වීම සහ බලය අයුතු ලෙස යෙදවීමක් සිදුවන්නේ නැතැයි සිතීම උගහටය.

අවසන් වශයෙන් ත්‍රස්තවාදය, වැළැක්වීමේ පනත ක්‍රියාවට නැංවීම පිළිබඳව පැහැදිලි කිරීමක් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අපේක්ෂා කරයි. මෙම තත්ත්වයෙහි දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අමතර රෙගුලාසි ප්‍රකාශයට පත් කෙරෙද්දී දෙසැම්බර් 6 වැනිදා ජාතිය අමතමින් ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළේ ආණ්ඩුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි එන විධිවිධාන නැවත ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද බවයි. 2002 පෙබරවාරියෙහිදී එළැඹගත් සටහන් විරාම ගිවිසුමෙහි එන රජයේ වගකීම් කොටසට අනුකූලව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ එන කිසියම් බලයක් භාවිතා කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුවට නොහැකිය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නැවත ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා ලද තීරණයේ ප්‍රතිඵල නිශ්චිත ලෙස පැහැදිලි කිරීමට ආණ්ඩුවට හැකි නම් එය මහත් උපකාරයක් වනු ඇත.

අප ඉතා ඕනෑකමින් ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ මෙහි දැක්වෙන කරුණු පිළිබඳ වහාම පැහැදිලි කිරීමක් කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයත් මූලික අයිතිවාසිකමුත් ශක්තිමත් කිරීම වෙත යොමු වන ලෙසයි.

වැඩි විස්තර සඳහා

අංක 237/22, විජය කුමාරතුංග මාවත, කොළඹ 5, (+94) 777 315665 ප්‍රකාශක - එස්. සිවකුමාර් 0777 315665 - කැඳවුම්කරු සුනන්ද දේශප්‍රිය (0777 312457) - ලේකම් - සුනිල් ජයසේකර (011 2851672/3) විද්‍යුත් තැපැලː fmm@diamond.lanka.net

## 6.3. ඇමුණුම 3:

**උතුරු නැගෙනහිර මාධ්‍ය නිදහස මර්දනය කිරීමට දැරෙන ප්‍රයත්න පිළිබඳව ආණ්ඩුව කණස්සල්ල පළකරයි. (ආණ්ඩුවේ ප්‍රවාත්ති අධ්‍යක්‍ෂ අනුෂ පැල්පිට මහතා විසින් නිකුත් කරන ලද නිවේදනය, 2006 ඔක්තෝබර් 27)**

**උතුරු නැගෙනහිර මාධ්‍ය නිදහස මර්දනය කිරීමට දැරෙන ප්‍රයත්න පිළිබඳව ආණ්ඩුව තම කණස්සල්ල පළ කරයි.**

උතුරේ සහ නැගෙනහිර දී මාධ්‍ය ක්‍රියාකාරිකයන් හට සහ මාධ්‍ය ආයතන වෙත ප්‍රහාර එල්ල වීම පිළිබඳව ආණ්ඩුව තම කණස්සල්ල පළ කරයි. මාධ්‍ය වෙත මෙම ප්‍රහාර එල්ල කරනු ලැබ ඇත්තේ ත්‍රස්තවාදී කණ්ඩායම් විසින් සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයෙන් පිටත සිටින බාහිර පාර්ශ්වයන් විසින් බව ආණ්ඩුවේ අවබෝධයයි.

ඉතා මෑතකදීම සිදු වූ සිද්ධිය නම් සඳුදා මඩකලපුවේදී වීරකේසරී පුවත්පතේ පිටපත් රාශියක් නාඳුනන කණ්ඩායමක් විසින් ගිනි තබනු ලැබීමයි. ආණ්ඩුව මේ සිද්ධිය පිළිබඳව කණගාටු වන අතර ඒ පිළිබඳ ඉක්මනින් පරීක්‍ෂණයක් පවත්වන ලෙස අණ කර තිබේ.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතා පොලිස්පතිවරයාට උපදෙස් දෙමින් පවසා ඇත්තේ මෙම සිද්ධීන් පිළිබඳ පරිපූර්ණ පරීක්‍ෂණ පවත්වා හැකිතාක් කඩිනමින් වාර්තා ඉදිරිපත් කරන ලෙසය.

ශ්‍රී ලංකා ආණ්ඩුව මාධ්‍ය නිදහස කෙරෙහි පූර්ණ වශයෙන් කැප වන අතරම මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ සහ මාධ්‍ය ආයතනවල ආරක්‍ෂාව සඳහා ගත හැකි සෑම පියවරක් ම නොකඩවා ගනියි. ප්‍රජාතන්ත්‍රවාදය තුළ කිසිසේත්ම පිළිගත නොහැකි, පුවත්පත් බෙදාහැරීම වැළැක්වීම සඳහා යොදනු ලබන ප්‍රයත්නයන් තොරතුරු ලබාගැනීමේ නිදහසට එල්ල කළ ප්‍රහාරයක් ලෙස ආණ්ඩුව සලකයි.

ජනතාවට තොරතුරු සැපයීම සඳහා මාධ්‍යයට පූර්ණ නිදහසක් ඇති අතර කිසිදු පුද්ගලයකුට හෝ කණ්ඩායමකට එම නිදහසට බාධා කරන්නට අයිතියක් නැත. කවර පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් කරනු ලැබුවත් මාධ්‍යයට එරෙහි හිංසනයත්, බිය ගැන්වීමත් ඉවසා සිටින්නට ශ්‍රී ලංකා ආණ්ඩුව සූදානම් නැත. ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස රැකබලා ගැනීමටත්. ශක්තිමත් කිරීමටත්, පෝෂණය කිරීමටත් ගත හැකි සියලු පියවරයන් ආණ්ඩුව විසින් ගැනෙනු ඇත.

අනුෂ පැල්පිට
ආණ්ඩුවේ ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂ

## 6.4. ඇමුණුම 4:

**අමාත්‍ය සහ ආරක්ෂක ප්‍රකාශක ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා වෙත සහ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා වෙත මෙම වාර්තාව සමඟ භාර දෙනු ලබන IMS සංවිධානයේ ලිපිය.**

ගරු ඇමැතිවරුනි,

ජාත්‍යන්තර මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳව වූ දූත මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද ,ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස : පැවැත්ම සඳහා වූ අරගලය, නම් වාර්තාව ඔබ වෙත පිරිනමන්නට මම කැමැත්තෙමි.

මෙම වාරත්ව පදනම් වන්නේ පසුගිය වසරේ ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර දූත කණ්ඩායම විසින් සොයා ගනු ලැබූ තොරතුරු මතය. මෙම වාර්තාව සම්පාදනය කරන ලද්දේ ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය, ජාත්‍යන්තර පුවත්පත් ආයතනය, ජාත්‍යන්තර ප්‍රවෘත්ති ආරක්ෂණ ආයතනය, යුනෙස්කොව සහ මගේ සංවිධානය වූ ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගීතාවය විසින් වුවද මෙම ජාත්‍යන්තර දූත පිරිසට ජාත්‍යන්තර මාධ්‍ය නිදහස් සංවිධාන දහ හතරක් සහභාගි වූ බව ඔබට මතක ඇතැයි සිතමි.

මෙම වාර්තාව විසින් වත්මනෙහි දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය පිළිබඳව මධ්‍යස්ථ සලකා බැලීමක් සපයා දී තිබේ. මෙහි මාතෘකාව තුළ පෙන්වා දී ඇති අන්දමට දූත මණ්ඩලයේ සොයා ගැනීම් වලින් පෙනී යන්නේ වසරකට පෙර දී ගැටුම්කාරි තත්ත්වය උත්සන්න වීමේ පටන් දිවයිනේ ප්‍රකාශනයේ නිදහසත් මාධ්‍ය නිදහස් වටපිටාවත් බලවත් ලෙස බාදනය වන්නට පටන්ගෙන ඇති බවකි. ඒ නිසාම අනාරක්ෂිත භාවය මෙන්ම හිංසනයටද පිටුබලයක් ලැබී ඇති බවකි. මාධ්‍යයට එරෙහිව සිදුවන ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාව මාධ්‍ය ක්‍රියාකාරිකයනට වඩාත් අනතුරුදායක රටවල් අතුරින් එකක් බවට පත්වෙමින් තිබේ. මෙම සංදර්භය තුළ ගැටුම්කාරී පාර්ශ්වයන් වල, සහ ඔවුන් සමග ඇසුරුකරන අතුරු හමුදාමය කණ්ඩායම්, මාධ්‍ය ක්‍රියාකාරිකයන් ඍජු ලෙසම බිය ගැන්වීමත් මරා දැමීමත් කරන බව වාර්තා වී තිබේ. තවදුරටත් ගතහොත් ඍජු සහ වක්‍ර වාරණයන් මගින් මූලික අයිතිවාසිකම් වූ ප්‍රකාශනයේ නිදහස මත පදනම් වන විවෘත මාධ්‍ය වාතාවරණය විනාශ වීමේ තර්ජනයක් පැනනැගී තිබේ.

ජාත්‍යන්තර දූත මණ්ඩලය 2006 ඔක්තෝබර් මාසයේදී ගරු කෙහෙළිය රඹුක්වැල්ල අමාත්‍යවරයා හමු වූ අවස්ථාවෙහි, මාධ්‍ය ක්‍රියාකාරිකයන් ගණනාවක් ඝාතනය කිරීම් සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන බවට එතුමා සහතික විය. ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය (ෂතඑ) මාධ්‍ය ක්‍රියාකාරිකයන් නව දෙනෙකුගේ ඝාතන පිළිබඳව තොරතුරු 2006 ඔක්තෝබර් 26 දිනැති විවෘත ලිපියකින් ගරු කෙහෙළිය රඹුක්වැල්ල අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. එතැන් සිට අදාළ බලධාරීන් එම ඝාතන පිළිබඳ පරීක්ෂණ පවත්වනු ලබන්නට ඇතැයි අපි සිතමු. ඒ මගින් දිවයිනේ මුක්තියේ සංස්කෘතියක් තවදුටත් නැතැයි පැහැදිලි පණිවුඩයක් නිකුත් කෙරෙන්නට ඇතැයි ද සිතමු.

කිසිදු පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් මාධ්‍ය ක්‍රියාකාරිකයන් සහ ජනමාධ්‍ය ආයතන වෙත ප්‍රහාර එල්ල කිරීමේ උත්සාහයන් ආණ්ඩුව කිසිවිටෙකත් ඉවසන්නට සූදානම් නැතැයි ප්‍රකාශ කෙරෙන ආණ්ඩුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ අනුෂ පැල්පිට මහතාගේ ප්‍රකාශයද අපි අගය කරමු. එම ප්‍රකාශයේ සඳහන් වන ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නියමයෙන් පොලිස්පති වරයා විසින් මෙම සිදුවීම් අරභයා පුළුල් පරීක්ෂණ පවත්වනු ලැබීමත්, හැකිතාක් ඉක්මනින් ඒ පිළිබඳ වාර්තා කරනු ලැබීමත් යන කරුණු පිළිබඳව වැඩිදුරට තොරතුරු දැන ගැනීමට ජාත්‍යන්තර දූත මණ්ඩලය බලාපොරොත්තු වෙයි.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා විසින් පළකරනු ලැබූ කැපවීමත් අනුෂ පැල්පිට මහතාගේ ප්‍රකාශනයේත් පසු විපරමක් ලෙස පෙර කී ඝාතන

සම්බන්ධ පරීක්ෂණ වල ප්‍රගතිය පිළිබඳව ප්‍රසිද්ධ ප්‍රකාශයක් සිදු කෙරුණොත් එය මේ කරුණු සම්බන්ධයෙන් වූ රජයේ ගැඹුරු කැපවීම ප්‍රදර්ශනය කරන්නක් වනු ඇත.

2006 ඔක්තෝබරයේ අපගේ දූත මණ්ඩලයේ පැමිණීමෙන් පසුව ඇති වී තිබෙන වර්ධනයන් දෙකක් කෙරෙහි ජාත්‍යන්තර දූත මණ්ඩලය විශේෂ අවධානය යොමු කරයි. පළමුවැන්න 2006 දෙසැම්බරයේ සිට ක්‍රියාත්මක වන නව හදිසි නීති (ත්‍රස්තවාදය සහ විශේෂිත ත්‍රස්ත ක්‍රියාවන් වැළැක්වීම සහ තහනම් කිරීම) රෙගුලාසි නිසා මාධ්‍ය නිදහස කෙරෙහි ඇති වී තිබෙන අනියත බලපෑම්ය. එම රෙගුලාසි වල ත්‍රස්තවාදය අර්ථ නිරූපනය කිරීමෙහි ලා ඇති පුළුල් භාවය ප්‍රජාතන්ත්‍රවාදයටත් ප්‍රකාශනයේ නිදහසටත් සැබෑ තර්ජනයකි. එසේම එය හේතුවෙන් දිවයිනේ සියලුම මාධ්‍යයන් ස්වයං වාරණයක් ඇතිකර ගැනීමට යොමු කෙරී තිබේ.

දෙවැන්න, ඔබ ද දන්නා පරිදි යාපනයේ පුවත්පත් මුහුණ දී තිබෙන මුද්‍රණ කඩදාසි සහ තීන්ත හිඟයයි. එහි ප්‍රතිඵලයක් ලෙස උදයන්, වාලම්පුරි සහ යාල් තිනක්කුරල් දිනපතා පුවත්පත් එදිනෙදා මුද්‍රණය කරනු ලබන පිටු 20 වෙනුවට දැන් මුද්‍රණය කෙරෙන්නේ පිටු හතරකිනි. මෙහි අවසානය ප්‍රකාශනයන් සහමුලින්ම මුද්‍රණය කිරීම නවතා දැමීමයි. මෙම තත්ත්වය උද්ගත වී තිබෙන්නේ කොළඹ සිට යාපනයට මුද්‍රණ කඩදාසි යැවීම වැළැක්වීමත් සමඟය. ඒ 9 මාර්ගය වසා දැමීමත් සමඟ යාපනය දක්වා වූ ප්‍රවාහණයට බාධාවක් ඇති වී තිබෙන බව අපි දනිමු. එවැනි තත්ත්වයකදී කොළඹ සිට යාපනයට මුද්‍රණ කඩදාසි සහ තීන්ත නැව් මගින් ප්‍රවාහණය කිරීම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදැයි වාර්තා වීම අවධානය යොමු කළ යුතු කරුණකි. ඔබ ද දන්නා පරිදි තොරතුරු ලබාගැනීමට ඇති හැකියාව ස්ථාවර භාවය සහතික කිරීමේ ප්‍රධාන අවශ්‍යතාවයකි. ප්‍රදේශයේ ජනතාව වෙත ප්‍රවෘත්ති සහ තොරතුරු සම්පාදනය කිරීමේ වගකිවයුතු මාධ්‍යවේදයක් නොමැති විටෙකදී එම ඉඩ සම්පූර්ණ කෙරෙන්නේ කටකථා මගිනි. එම වාතාවරණය අස්ථාවර භාවයටත් හිංසනයටත් මඟ පාදන්නකි. එම නිසා අප ඔබෙන් ඉල්ලා සිටින්නේ හැකි තාක් ඉක්මනින් ඉහළම මට්ටමින් මෙම ප්‍රශ්නය විසඳීමට මැදිහත් වන ලෙසයි. එපමණක් නොව, කොළඹ මුද්‍රණය වන දෙමළ පුවත්පත් නැගෙනහිර පළාතේ බෙදාහැරීම තහනම් කර ඇති තත්ත්වය පැවැතීමද සැලකිල්ලට ගත යුතුය.

අවසන් වශයෙන් 2006 දෙසැම්බර් 23 වනදා පිළිගන්නා ලද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1738 දරණ යෝජනාව ශ්‍රී ලංකාවේ තත්ත්වය සම්බන්ධයෙන් යෙදවීම ගැන ජාත්‍යන්තර දූත මණ්ඩලය අවධාරණය කරයි. මෙම තත්ත්වය සම්බන්ධව යට කී යෝජනාවේ මාධ්‍ය ක්‍රියාකාරිකයනට එරෙහි ප්‍රහාර හෙළා දැකීම, මුක්තිය අවසන් කිරීම සඳහා ජාත්‍යන්තර නීතිය යටතේ රාජ්‍යයන් අනුගමනය කළ යුතු අදාළ යුතුකම් සහිත වගකිවයුතු භාවය අවධාරණය කිරීම සහ මාධ්‍ය ක්‍රියාකාරීන්ගේ වෘත්තීයමය ස්වාධීන්තවය සහ අයිතීන්ට ගරුකිරීම යන කරුණු ඇතුළත්ය.

2006 මැයි මාසයේදී කොළඹ පැවැති ජාත්‍යන්තර ජනමාධ්‍ය දින උත්සවයේදී ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පැවැත්වූ දේශනයේ සඳහන් කරුණු නැවත මතක් කර ගනිමු. ,මාධ්‍ය නිදහස යනු, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාකිරීමේ වැදගත් මෙවලමකි. එසේම එය පුද්ගලික නිදහස නැති කරන පාලනයක් කරා ගමන් කිරීමට ඇති ඉඩකඩට එරෙහි වීම සහතික කරන්නකි,. ප්‍රකාශනයේ නිදහස ශ්‍රී ලාංකිකයන්ගේ මූලික අයිතියක් ලෙස පවත්වාගෙන යාම සහතික කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව ක්‍රියා කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

ජාත්‍යන්තර දූත මණ්ඩලය වෙත දැක්වූ ආණ්ඩුවේ විවෘත සහ සහයෝගාත්මක ආකල්පය අගය කරන අතරම මෙම ලිපියට ඔබේ ප්‍රතිචාර අපේක්ෂා කරමු.

ඔබේ අවංක

ජෙස්පර් හොජ්බර්ග් - Jesper Hojberg

විධායක අධ්‍යක්ෂ

ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගිතාවය

# 7 ජාත්‍යන්තර සංවිධානවල සබඳතා විස්තර

**International Federation of Journalists – Asia-Pacific**
245 Chalmers St, Redfern Sydney NSW 2016, Australia
Tel: +612 9333 0999
Tel: +91 981838 3669
Fax: +612 9333 0933
ifj@ifj-asia.org
ifjsouthasia@hotmail.com
www.ifj-asia.org

**International Media Support**
Wilders Plads 8A, 1403 Copenhagen K, Denmark
Tel: +45 32 69 89 89
Fax: +45 32 69 89 94
i-m-s@i-m-s.dk

**International Press Institute**
Spiegelgasse 2, A-1010 Vienna, Austria
Tel: (+ 43 1) 512 90 11
Fax:(+ 43 1) 512 90 14
ipi@freemedia.at

**International News Safety Institute**
International Press Centre, Résidence Palace, Block C, 155 rue de la Loi,
B-
1040 Brussels, Belgium
Tel: +32 2 235 22 01
Fax: +32 2 235 22 19
info@newssafety.com

**United Nations Educational, Scientific and Cultural Organization**
Division for Freedom of Expression, Democracy and Peace, 1, rue Miollis,
75732 Paris Cedex 15, France
Tel: +33 (0)1 45 68 10 00
Fax: +33 (0)1 45 67 16 90
www.unesco.org
and
UNESCO House, B 5/29 Safdarjung Enclave, New Delhi 110 029, India
Tel: +911 126 713 000
Fax: +911 126 713 001
www.unesco.org/newdelhi

ශ්‍රී ලංකාවේ දී මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලද්දේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසිනි.

ISBN87-989502-7-4